# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# Annual Report

# 2014














## හලාවත වැවිලි සමාගම
## சிலாபம் பெருந்தோட்ட நிறுவனம்
## Chilaw Plantations Ltd

පොල් සංවර්ධන සහ ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය.

தெங்கு அபிவிருத்தி மற்றும் மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சு.

Ministry of Coconut Development & Janatha Estate Development.

# අන්තර්ගතය


පිටු අංකය

## අපි ගැන

| | |
|---|---|
| ආයතනික විස්තර | 01 |
| අපගේ දැක්ම, මෙහෙවර | 02 |
| මූල්‍ය තොරතුරු විශේෂ අවස්ථා | 03 |
| සභාපති/ප්‍රධාන විධායක නිලධාරීතුමන්ගේ පණිවිඩය | 04-05 |

## සාමුහික පාලනය

| | |
|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩලය | 06 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය | 07 |
| කළමනාකරණ විමසුම | 08-15 |
| මූල්‍ය සමාලෝචනය | 16-19 |
| අධ්‍යක්ෂ මණ්ඩලයේ සංක්ෂිප්ත වාර්තාව | 20-22 |
| අවධානම් කළමනාකරනය | 23 |

## කමිටු වාර්ථා සහ පාලනය

| | |
|---|---|
| ආයතනික පාලන ප්‍රකාශය | 24 |
| අධ්‍යක්ෂ මණ්ඩල වගකීම පිළිබඳ ප්‍රකාශය | 25 |
| විගණන හා කළමනාකරණ කමිටු වාර්ථා | 26 |

## විගණන සහ මූල්‍ය වාර්තා

| | |
|---|---|
| විගණකවරුන්ගේ වාර්තාව | 27 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශය | 28 |
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 29 |
| ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය | 30 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 31 |
| මූල්‍ය ප්‍රකාශවල සටහන් | 32-53 |

## වෙනත් තොරතුරු

| | |
|---|---|
| පසුගි ය වසර 05 තුල සාරාංශගත ප්‍රතිඵල | 54 |
| වාර්ෂික මහා සභා රැස්වීම පිළිබඳ දැනුම්දීම | 55 |
| පෙරකලාසි අයදුම්පත | 56 |

# ආයතනික විස්තර

| | | |
|---|---|---|
| සමාගමේ නාමය | ඃ | සිමාසහිත හලාවත වැවිලි සමාගම |
| ප්‍රධාන කාර්යාලය | ඃ | "කප්රුක සෙවන" අංක 165, පුත්තලම පාර, හලාවත, 61000 |
| කොළඹ කාර්යාලය | ඃ | ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, නො. 191, ධර්මපාල මාවත, කොළඹ 07. |
| සංස්ථාපනය කළ දිනය | ඃ | 1992 ජුනි 11 වැනි දින |
| සමාගම් ලියාපදිංචි අංකය | ඃ | PB 703 (නව අංකය 2007 අංක 07 දරන නව සමාගම් පනත) |
| නෛතික තත්වය | ඃ | 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ විධිවිධාන වලට අනුකූලව, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ස්ථාපනය කරන ලද පූර්ණ රජයට අයිති සමාගමකි. (පසුව 2007 අංක 7 දරණ නව සමාගම් පනතට අනුව යලි ලියාපදිංචි කරන ලදි) |
| කොටස් හිමිකම් | ඃ | සමාගමේ සියලු කොටස්වල අයිතිය (100%) එහි ස්වර්ණමය කොටස සමග හිමිකරුවන ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ශ්‍රී ලංකා ජනරජයේ මහා භාණ්ඩාගාර ලේකම් විසින් උසුලනු ලබයි. |
| කොටස් ප්‍රාග්ධනය | ඃ | විශේෂ වරප්‍රසාද සහිත ස්වර්ණමය කොටසද ඇතුලත්ව රුපියල් දහයේ (රුඃ 10/-) කොටස් 20,000,001 ක් මහා භාණ්ඩාගාරය සතුය. |

**වත්මන් අධ්‍යක්ෂක මණ්ඩලය**

| | |
|---|---|
| ගාමිණී රාජකරුණා මහතා (27/11/2014 සිට 31/12/2014) | සභාපති/ප්‍රධාන විධායක නිළධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| පණ්ඩුක ජයසිංහ මහතා (24/09/2013 සිට 27/11/2014) | සභාපති/ප්‍රධාන විධායක නිළධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| ඒ.එම්. චන්ද්‍රපාල මහතා | විධායක අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| ඕ.පි.පි. පතිරණගේ මහතා | ක්‍රියාකාරී අධ්‍යක්ෂ සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| ප්‍රියංගනි ලියනගේ මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සහ මහා භාණ්ඩාගාර නියෝජිතවරිය |
| එස්. චන්ද්‍රා එස්. ප්‍රනාන්දු මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| කේ. බි. රත්නායක මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| ආර්. ආර්. එම්. අමරතුංග මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| අයි. එම්. ආර්. විදානගමගේ මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |

| | | |
|---|---|---|
| බාහිර විගණකවරුන් | ඃ | අයියර් සහ සමාගම<br>වරලත් ගණකාධිකාරීවරුන්,<br>හැව්ලොක් සෙන්ට්‍රල් ගොඩනැගිල්ල, 104 - 4/1, හැව්ලොක් පාර, කොළඹ 05. |
| බැංකුකරුවන් | ඃ | ලංකා බැංකුව |
| සමාගම් ලේකම්වරුන් | ඃ | කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් පුද්ගලික සමාගම<br>අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07. |

## අපගේ දැක්ම

වඩාත් විද්‍යානුකූලව හා ලාභදායීව පාලනය කරනු ලබන ශ්‍රී ලංකාවේ හොඳම පොල් ආශ්‍රිත වැවිලි සමාගම බවට පත්වීම.

## අපගේ මෙහෙවර

පොල් වගාවේ සම්පත් හා වත්කම් විද්‍යාත්මකව සහ වානිජ්‍යමය ලෙස සංවර්ධනයෙන් තිරසාරවූ ඉහළ ලාභයක් සමගම විභව ඵලදාවක් සහ ඵලදායීතාවයක් ලැබීමට කැපවීමෙන් කටයුතු කරන අපේ ප්‍රවීන කාර්ය මණ්ඩලය දිරිමත්ව බල ගැන්වීමෙන් වත්මන් මෙන්ම අනාගත සියලු කොටස්කරුවන්ට වාසි අත්වන අන්දමින් ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යක් බවට පත්කිරීමේ මහඟු ජාතික ක්‍රියාවලියට දායකවෙමු.

# මූල්‍ය තොරතුරු විශේෂ අවස්ථා

(2014 දෙසැම්බර් මස 31 වන දිනට)

| | 2014 | 2013 | වෙනස% |
|---|---|---|---|
| පොල් නිශ්පාදනය (ගෙඩි '000) | 12,969 | 9,595 | 35% |
| **සාරාංශ ප්‍රතිඵල** | **රු. 000** | **රු. 000** | |
| | | | |
| | | | |
| ආදායම | 374,851 | 287,152 | 30.54 |
| දළ ලාභය | 152,726 | 112,890 | 35.29 |
| පොලිය සහ බදු පෙර ලාභය | (31,966) | 108,989 | (129.33) |
| බදු පෙර ලාභය | (61,273) | 81,820 | (174.89) |
| බදු පසු ලාභය | (61,680) | 72,919 | (184.59) |
| රඳවාගත් ලාභය | 543,862 | 625,542 | (13.06) |
| ගෙවූ ලාභාංශ | | 20,000 | |
| මුළු ලාභාංශ | 396,650 | 396,650 | |
| **මූල්‍ය තත්වය** | | | |
| ජංගම නොවන වත්කම් | 792,832 | 737,497 | 7.50 |
| මේරූ/නොමේරූ වගා | 581,618 | 502,826 | 15.67 |
| ජංගම වත්කම් | 233,545 | 356,230 | (34.44) |
| තොග | 73,432 | 71,398 | 2.85 |
| කෙටි කාලීන ආයෝජන (ස්ථාවර තැන්පතු) | 113,276 | 128,996 | (12.19) |
| මුළු වත්කම් | 1,026,376 | 1,093,727 | (6.16) |
| ජංගම වගකීම් | 57,100 | 45,452 | 25.63 |
| ජංගම නොවන වගකීම් | 225,414 | 222,734 | 1.20 |
| කොටස් ප්‍රාග්ධනය | 200,000 | 200,000 | |
| කොටස් කරුවන්ගේ අරමුදල් | 743,861 | 825,542 | (9.89) |
| | | | |
| **මූල්‍ය දර්ශක** | | | |
| ජංගම අනුපාතය (වාර) | 4.09 | 7.84 | (47.81) |
| ක්ෂණික අනුපාතය (වාර) | 2.80 | 6.27 | (55.25) |
| දළ ලාභ අනුපාතය | 40.74 | 39.31 | 3.64 |
| කොටසක ඉපයීම් රු. | (3.10) | 3.69 | (184.01) |
| සාමාන්‍ය ස්කන්ධයට ආපසු ලැබීම් (ROE) - % | (7.86) | 8.80 | (189.32) |
| ප්‍රාග්ධන යෙදවීමට ආපසු ලැබීම් (ROCE) - % | (3.30) | 10.40 | (131.72) |
| ජංගම වත්කම් වලට ජංගම වගකීම | 0.06 | 0.04 | 33.87 |
| කොටස් කරුවන්ගේ අරමුදල් අනුපාතය | 72.47 | 75.48 | (3.98) |
| පොලි ආවරණ (වාර) | (1.09) | 3.98 | (127.40) |

# සභාපතිතුමා/ප්‍රධාන විධායක නිළධාරීගේ පණිවුඩය

සීමාසහිත හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් 2014 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව හා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට ලැබීම මට ඉමහත් සතුට අත් කර දෙන්නකි.

2014 වසරේ වාර්ෂික වර්ෂාපතනයේ වර්ධනයක් ඇති වුව ද වයස් ඉක්ම වූ ගස් ඉවත්වීම නිසා ඇතිවන අඩුව පිරවීමට තරුණ ගස් ප්‍රමාණවත් නොවීම නිසා 2013 වසරේ ඵල දරණ සමස්ත පොල් ගස් ප්‍රමාණය වූ 340,586 සිට 313,048 දක්වා අඩු වී ඇත. ඊට හේතුව වී ඇත්තේ පුද්ගලික කළමනාකාරීත්වය යටතේ තිබූ සමයේ ප්‍රමාණවත් මට්ටමින් යටි වගා සිදු නොකිරීමයි. මෙහි අවසාන ප්‍රතිඵලය වූයේ 2010 වසරේ ලත් මිලියන 18.26 ක් වූ මුලු පොල් ඵලදාව හා සන්සන්දනාත්මකව බැලු කල 2013 වර්ෂ අවසානය වන විට සමස්ත පොල් ඵලදාව මිලියන 9.6 දක්වා අඩු වීමයි. 2014 වසරේ දී ලැබුනු ගෙඩි 12,969,381 ක ප්‍රමාණය 2013 ට සාපේක්ෂ්ව 35% ක වර්ධනයක් පෙන්වා ඇත. මෙය වෙනත් ආකාරයකින් දැක්වුවහොත් පොල් ගස් ප්‍රමාණය අඩු වුවද, 2013 වර්ෂයේ ගසකින් ලැබුණු ගෙඩි 31 ට සාපේක්ෂව 2014 වර්ෂයේ දී ගෙඩි 46 ක් ලබා ගැනීමට හැකිවිමෙන් ඵලදායීතාව වර්ධනයවීම දැක්විය හැකිය. මෙය යහපත් තත්වයකට වගාව පත් වීමේ සුබ පෙරමග සළකුණකි.

වැසි ජලය රැස් කර ගැනීම සඳහා වූ වැඩසටහන තවදුරටත් ඉදිරියට කර ගෙන යන අතර ඒ යටතේ බිංගිරිය, මාදම්පේ හා දිවුලපිටියේ පිහිටා ඇති වැව් පොකුණු පිරිවැයක් දරා සංවර්ධනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම වතුවල පාංශු තත්වය වැඩි දියුණු වී ඇති අතර වගා කර ඇති භෝගවල වර්ධනයක් පෙන්නුම් කර ඇත. පොල් ලෙලි වැළලීම හා පොල් අතු වසුන් යෙදීම වැනි සාම්ප්‍රදායික පාංශු තෙතමන ආරක්ෂා කර ගැනිමේ කටයුතු අවශ්‍යතාවය අනුව කෙරෙමින් පවති. අත්‍යාවශ්‍ය කටයුත්තක් වන පොහොර හා ඩොලමයිට් යෙදීම ද සිදු කෙරේ.

පුත්තලම තම්බිපණ්නි වත්තේ පසුගිය වසරේ දි ආරම්භ කළ කජු සැකසීමේ මධ්‍යස්ථානය අගනා වර්ධනයක් අත්කර ගැනිම හේතු කොටගෙන කොළඹ - මන්නාරම ප්‍රධාන මාර්ගයේ මංගලඑලිය හා කාසමඩු යන ස්ථානවල තවත් අලෙවිහල් දෙකක් විවෘත කෙරිනි. තවද, මෙම අලෙවි ස්ථාන වල දී පලුගස්වැව පිරිසිදු මී කිරි හා යෝගට් අලෙවි කිරීම මගින් අතිරේක ආදායමක් ද උපයා ගැනීමට හැකිවී ඇත.

දිවුලපිටියේ අතුරු බෝගයක් ලෙස වගාකළ කුරුදු වගාවේ පළමු අස්වනු නෙලීම මේ වසරේ දි ලබා ගැනිමට හැකි විය. එම ව්‍යාපෘතියෙන් මනා අස්වැන්නක් ලබා ගැනීමට හැකිවිය.

### ආදායම හා ලාභය

2014 වසරේ අයභාරය 2013 වසරේ ලත් රු. මිලියන 287 හා සන්සන්දනාත්මකව බැලු කළ රු. මිලියන 375 ක් දක්වා වැඩි විය. 2013 වසෙර් රු. 30/- ක් වූ ශුද්ධ අලෙවි සාමාන්‍යයට සාපේක්ෂව 2014 වසරේ ශුද්ධ අලෙවි සාමාන්‍යය (NSA) ගෙඩියකට රු. 29/- ක් ලෙස අඩුවුව ද අයභාරය වැඩි කර ගත හැකි විය.

රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ එවකට සිටි ලේකම්වරයාගේ උපදෙස් අනුව 2010 වසෙර් දී රාජ්‍ය ආයතන සඳහා රු. මිලියන 105 ක තාවකාලික මූල්‍ය පහසුකම් කෙටි කාලීන ණයක් ලෙස සමාගම විසින් බෙදාදී ඇත.

කෙසේ වුවද, සිහිකැඳවීම් රැසක් යොමු කළද 2010 සිට 2014 වසර වන තෙක් ණය වාරික හා උපචිත පොලී ගෙවීම් අදාළ පාර්ශව විසින් සිදු කර නොතිබුණි.

උක්ත කරුණු කෙරේ අවධානය යොමුකළ සීමාසහිත හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය 2014 අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය වත්කම් (බොල් ණය හා අඩමාන ණය ප්‍රතිපාදන) හානිකරණය වෙනුවෙන් පූර්ණ ප්‍රතිපාදන සැලසීමක් කිරීමට තීරණය කර ඇත.

උක්ත මූල්‍ය පහසුකම් වෙනුවෙන් කරන ලද රු. මිලියන 119.7 ක බොල් ණය හා අඩමාන ණය ප්‍රතිපාදන (මූල්‍ය වත්කම් පිළිබඳ හානිකරණය වීමේ අලාභය) සැලසීමෙන් අනතුරුව, 2014 වසරේ ශුද්ධ පාඩුව රු. මිලියන 61.6 ක් විය.

රාජ්‍ය වැවිලි සමාගමක් වන සීමාසහිත හලාවත වැවිලි සමාගම විසින් 2013 වසර වෙනුවෙන් 2014 වර්ෂයේදී ලාභාංශ ලෙස රුපියල් මිලියන 20 ක් අධ්‍යක්ෂක මණ්ඩලයේ හා පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශයේ අනුමැතිය මත මහා භාණ්ඩාගාරය වෙත ලබා දුනි.

# සභාපතිතුමා/ප්‍රධාන විධායක නිළධාරිගේ පණිවුඩය

### ජයග්‍රහණ හා දායකත්වයන්

2014 වසරේ පැවති ජාතික කෘෂි ව්‍යාපාරික සමුළුවේදී මධ්‍යම තලයේ නිෂ්පාදන වැවිලි සමාගම් සඳහා වන ලෝකඩ පදක්කම සමාගමෙහි සමස්ත කාර්ය මණ්ඩලයේම කැපවීම නිසා නැවත වතාවක් දිනා ගැනීමට හැකිවිය.

සමාගම විසින් පලුගස්වැව වත්තේ 2011 වසරේ ආරම්භ කොට පවත්වා ගෙන යන අත් පරාගන වැඩසටහන මගින් උසස් ප්‍රමිතියෙන් යුතු බීජ පොල් නිෂ්පාදනය කර ගැනීමට හැකි වූ අතර, මෙම ව්‍යාපෘතිය යටතේ පළමු පොල් පැල නිකුත් කිරීම 2013 වසරේ දී සිදු විනි. මෙම ව්‍යාපෘතිය මගින් පසුගිය වසර තුන තුල බීජ පොල් 38,080 ක් තවාන් කරන ලදී. එමගින් අප යටි වගා වලට අවශ්‍ය නිරෝගී බීජ සපයා ගැනීමට හැකි විය.

දෙමුහුන් බීජ පොල් නිෂ්පාදනය සඳහා බිංගිරිය කිනියම වත්තේ අක්කර 100 ක ප්‍රදේශයක් පුරා පොල් පර්යේෂණ ආයතනය සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරන වැඩසටහනෙහි ප්‍රගතිය ප්‍රශංසනීය මට්ටමක පවතී. මෙම දෙමුහුන් බීජ පොල් යොදා කර ඇති පොල් වගාව ඉදිරි වසර දෙක හමාරකට පසුව අස්වනු ලබා ගත හැක.

### කළමණාකරනය හා මානව සම්පත්

කාර්යසාධනය හා ඵලදායිත්වය වර්ධනය කිරීම සඳහා විධායක ශ්‍රේණියේ නිලධාරීන් හා කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පවත්වන ලදී.

### තුති පිදුම

මෙම සාර්ථකත්වය අත් කර ගැනීම සඳහා දැඩි අවංකත්වයෙන් තම සේවය ලබා දුන් වතු අධිකාරීවරුන්, සහකාර වතු අධිකාරීවරුන්, කාර්යාලීය සියළු කාර්ය මණ්ඩලය, ආයතනය වෙනුවෙන් තම දායකත්වය ලබා දුන් සියළුම වතු සේවකයන්ටත්, ගරු අමාත්‍යතුමා, ලේකම්තුමා හා තම සහයෝගය ලබා දෙමින් නිරතුරුව අප සමග එක්වී සිටි අමාත්‍යාංශයේ වෙනත් සියලුම නිලධාරීන් සහ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත මාගේ හදපිරි කෘතවේදිත්වය හා අවංක ස්තුතිය පුද කිරීමට මා මෙය අවස්ථාවක් කර ගැනීමට කැමැත්තෙමි.

රවීන්ද්‍ර හේරත්
සභාපති/ ප්‍රධාන විධායක නිළධාරි
සීමාසහිත හලාවත වැවිලි සමාගම

# අධ්‍යක්ෂ මණ්ඩලය

**01. ගාමිණි රාජකරුණා මහතා - (27/11/2014 සිට 31/12/2014)** 071 8438488
සභාපති/ප්‍රධාන විධායක නිලධාරි සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
(ලේකම් පොල් සංවර්ධන සහ ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය)
නො. 36/2, ගල්මඩුවවත්ත නිවාස යෝජනා ක්‍රමය, ගල්මඩුවවත්ත

**02. පණ්ඩුක ජයසිංහ මහතා - (24/09/2013 සිට 27/11/2014)** 071 6884082
සභාපති/ප්‍රධාන විධායක නිලධාරි සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
නො. 27, 1 වන පටුමග, කොටුබැම්ම පාර, ඇතුල්කොට්ටේ.

**03. ඒ. එම්. චන්ද්‍රපාල මහතා** 077 3321551
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සහ විධායක අධ්‍යක්ෂ
පලාත් සභා අමාත්‍යාංශයේ හිටපු ලේකම්, විශ්‍රාමලත් SLAS විශේෂ පංති නිලධාරි
165/1A, දුටුගැමුණු වීදිය, කොහුවල.

**04. ඕ.පී.පී. පතිරණගේ මහතා** 077 7903922
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සහ ක්‍රියාකාරි අධ්‍යක්ෂ
වලාකඩවත්ත, උල්විටිකේ, ගාල්ල

**05. ප්‍රියංගනි ලියනගේ මහත්මිය** 077 7898841
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික සහ මහා භාණ්ඩාගාර නියෝජිතවරිය
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී PED, මහා භාණ්ඩාගාරය

**06. චන්ද්‍රා ප්‍රනාන්දු මහතා** 011 2580561 / 011 2553321
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
විශ්‍රාමලත් පොලිස්පති (IGP), අතිගරු ජනාධිපතිතුමාගේ ජ්‍යෙෂ්ඨ උපදේශක
අංක 3, ෂර්බරි උද්‍යානය, කොළඹ 04.

**07. කේ.බී. රත්නායක මහතා** 072 2229160
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
නො. 22, දික්යාය, බුත්තල.

**08. ආර්.ආර්.එම්. අමරතුංග මහතා** 077 7751443
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
නො. 7/44, පාසැල් මාවත, ගංගොඩවිල, නුගේගොඩ.

**09. අයි. එම්. ආර්. විදානගමගේ මහතා** 077 3088478
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
'තරිඳු', බුද්ධියගම, වීරකැටිය.

# ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

| | | | |
|---|---|---|---|
| 01. | ගාමිණී රාජකරුණා මහතා (27/11/2014 සිට 31/12/2014) | සභාපති/ප්‍රධාන විධායක නිලධාරි | 071 8438488 |
| 02. | පණ්ඩුක ජයසිංහ මහතා (24/09/2013 සිට 27/11/2014) | සභාපති / ප්‍රධාන විධායක නිලධාරි | 071 6884082 |
| 03. | ඒ. එම්. චන්ද්‍රපාල මහතා | විධායක අධ්‍යක්ෂ | 077 7774892 |
| 04. | ඔ.පි.පි. පතිරණගේ මහතා | ක්‍රියාකාරි අධ්‍යක්ෂ | 077 7903922 |
| 05. | ටි.වි.ඩි.ඩි.එස් කරුණාරත්න මහත්මිය | සාමාන්‍යාධිකාරි (වැඩ බලන) | 076 6904905 |
| 06. | ඩී. ජී. ඒ. ආර්. ද සිල්වා මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (වැවිලි) | 071 4173203 |
| 07. | ඩබ්ලිව්. එල්. ඩී. ප්‍රනාන්දු මහතා | සහකාර සාමාන්‍යාධිකාරි (වැවිලි ඉන්ජිනේරු) | 077 7364907 |
| 08. | බි. හෙට්ටිආරච්චි මහතා | සහකාර සාමාන්‍යාධිකාරි (වැවිලි) (17/11/2014 සිට) | 071 8413943 |
| 09. | ආර්. එම්. ආර්. බී. රත්නායක මහතා | ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී | 071 8478569 |
| 10. | එච්. පී.එම්. ඩබ්ලිව්. හේමචන්ද්‍ර මහතා | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 071 8441536 |
| 11. | එම්.එම්. මර්ලි මහතා | වතු කළමනාකාර (i) | 077 6746458 |
| 12. | ඒ.ඒ. අශෝක ආනන්ද මහතා | වතු කළමනාකාර (ii) | 071 5285866 |
| 13. | ඩබ්. කැලුම් ප්‍රදිප් මහතා | කළමනාකාර (තාක්‍ෂණ සහ සංවර්ධන) | 071 8351431 |
| 14. | ඒ.එම්.ටි.බි. අතපත්තු මහතා | කළමනාකාර (මානව සම්පත් හා පාලන) | 077 3799003 |
| 15. | එම්.කේ.එන්. අබේධීර මහතා | කළමනාකාර (මූල්‍ය) | 071 8608954 |
| 16. | ඒ.එන්.ඒ.එස්. කරුණාතුංග මහතා | කළමනාකාර (විකුණුම්) | 077 3413838 |
| 17. | බී. හෙට්ටිආරච්චි මහතා | වතු අධිකාරි, තම්බපණ්ණි පළාත් වතුයාය (17/11/2014 දක්වා) | 071 8413943 |
| 18. | ජේ. එච්. ප්‍රනාන්දු මහතා | වතු අධිකාරි, පලුගස්වැව වතුයාය | 071 4244248 |
| 19. | පී.එම්.ඒ. කරුණාතිලක මහතා | වතු අධිකාරි, හලාවත පළාත් වතුයාය | 071 8363615 |
| 20. | ඩි.එම්.පී.ඒ. දිසනායක මහතා | වතු අධිකාරි, බිංගිරිය පළාත් වතුයාය | 071 8504698 |
| 21. | සී.ඩයස් මහතා | වතු අධිකාරි, දිවුලපිටිය පළාත් වතුයාය | 077 3586974 |
| 22. | බී. එම්. යූ. බී. බස්නායක මහතා | වතු අධිකාරි, මාදම්පෙ පළාත් වතුයාය | 077 3156774 |

# කළමනාකරණ විමසුම

**පොල් ඵලදායිතාවය**

පුත්තලම සිට කටුනායක දක්වා මුහුදුබඩ ප්‍රදේශයෙන් නිකවැරටියේ සිට දිවුලපිටිය දක්වා ගොඩබිම් පුරා පොල් වගාව හෙක්ටයාර් 4464.12 සහිතව හෙක්ටයාර් 5733.23 ක මුළු බිම් ප්‍රමාණයක වියළි කලාපය, ශුෂ්ක කලාපය හා තෙත් කලාපය වැනි විවිධාකාර වූ කාලගුණික හා දේශගුණික වෙනස්කම් සහිත පහත ස්ථාන වල පිහිටා ඇති වතු කලාප සීමාසහිත හලාවත වැවිලි සමාගම යටතේ පාලනය කෙරේ.

| වත්තේ නම | | ප්‍රමාණය (හෙක්.) | කලාපය |
|---|---|---|---|
| 1 | බිංගිරිය වතු කලාපය | 1,509.66 | අර්ධ ශුෂ්ක |
| 2 | හලාවත වතු කලාපය | 645.57 | අර්ධ ශුෂ්ක |
| 3 | දිවුලපිටිය වතු කලාපය | 424.49 | තෙත් |
| 4 | මාදම්පේ වතු කලාපය | 655.86 | තෙත් |
| 5 | පලුගස්වැව වත්ත | 672.22 | අර්ධ ශුෂ්ක |
| 6 | තම්බපන්නි වතු කලාපය | 1,825.43 | වියළි |

වියළි කලාපයේ අඩු අස්වැන්නක් හා තෙත් කලාපයේ වැඩි අස්වැන්නක් ලෙසත් ප්‍රදේශයෙන් ප්‍රදේශයට සාපේක්ෂව වෙනස් පරාසයන් තුළ රැඳෙමින් ගසකින් ගෙඩි 46 ක සාමාන්‍ය අස්වැන්නක් වාර්තා කර ඇත.

කාලයක් පුරා පැවිති දැඩි නියං තත්වය හා 2012 වසරේ පැවති කර්කශ නියගය නිසා අස්වනු පසුබෑමකට ලක් වි ඇත. එම නියගය හලාවත වැවිලි සමාගමට ඉහළ අස්වනු ලබා දුන් ගස් 19,239 කට වැඩි සංඛ්‍යාවක් අහිමිවී තවත් ගස් 20,000 ක වර්ධනය හා ඵලදායිත්වය අඩාලවීම මගින් ඵල දරන ගස් ප්‍රමාණය 283,449 දක්වා අඩුවිය. 2014 වසරේ පොල් ඵලදාව ගෙඩි 12,969,381 ක් විය.

එය පහත දක්වා ඇත.

| වසර | පොල් අස්වැන්න (ගෙඩි) | වෙනස | ඵලදාව දෙන ගස් ප්‍රමාණය | වෙනස | ඵලදායිත්වය (ගසක ගෙඩි ප්‍රමාණය) | ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය (මිලියන) | වෙනස |
|---|---|---|---|---|---|---|---|
| 1992 | 20,782,648 | 0 | 421,875 | | 49 | 2,296 | 0 |
| 1993 | 19,145,214 | -8 | 407,512 | -05% | 47 | 2,164 | - 6% |
| 1994 | 21,382,314 | +12 | 426,722 | +03% | 50 | 2,622 | +21% |
| 1995 | 22,603,156 | +6 | 441,379 | +04% | 51 | 2,275 | + 5% |
| 1996 | 19,336,658 | -14 | 421,716 | -04% | 46 | 2,546 | - 8% |
| 1997 | 19,235,974 | -1 | 412,006 | -02% | 47 | 2,630 | + 3% |
| 1998 | 18,921,808 | -2 | 415,718 | +01% | 46 | 2,522 | - 4% |
| 1999 | 21,348,626 | +13 | 393,360 | -05% | 54 | 2,828 | +12% |
| 2000 | 23,216,882 | +9 | 399,454 | +02% | 58 | 2,396 | + 9% |
| 2001 | 21,829,630 | -6 | 395,435 | -01% | 55 | 2,769 | -11% |
| 2002 | 15,031,795 | -31 | 413,465 | +05% | 36 | 2,392 | -14% |
| 2003 | 17,585,652 | +17 | 402,937 | -03% | 44 | 2,562 | +11% |
| 2004 | 18,354,614 | +4 | 401,162 | 00% | 46 | 2,591 | +1% |
| 2005 | 14,391,265 | -22 | 408,006 | +02% | 35 | 2,515 | - 3% |
| 2006 | 17,070,324 | +19 | 411,968 | +01% | 41 | 2,785 | +11% |
| 2007 | 17,815,317 | + 4 | 395,762 | -04% | 45 | 2,869 | + 3% |
| 2008 | 16,280,051 | - 9 | 378,333 | -04% | 43 | 2,908 | + 1% |
| 2009 | 18,632,247 | +14 | 380,000 | 00% | 49 | 2,762 | - 5% |
| 2010 | 18,256,007 | -2 | 340,586 | -10% | 54 | 2,317 | -16% |
| 2011 | 14,527,770 | -20 | 353,113 | +04% | 41 | 2,808 | + 9% |
| 2012 | 15,807,753 | +9 | 312,456 | -12% | 51 | 2,940 | + 5% |
| 2013 | 9,595,275 | -39 | 313,048 | +01% | 31 | 2,513 | -14% |
| 2014 | 12,969,381 | 35 | 283,449 | -9% | 46 | 2,870 | 14% |




2000 වසරේ දී 400,000 ක් වූ ඵල දරණ මුළු ගස් ප්‍රමාණය 2014 වර්ෂයේදී ද 283,000 තෙක් අඩුවී ඇත.2000 වසරේ පැවති රු. මිලියන 23 ක් වූ පොල් අස්වැන්න 2014 වර්ෂයේ දී මිලියන 13 ක් දක්වා අඩු වී ඇත. ගසකට ඵලදාව ගෙඩි 46 ක මට්ටමක පවතී.

### මානව සම්පත් කළමණාකරනය

ශ්‍රී ලංකා වතු හා හාම්පුතුන්ගේ සංගමය හා කම්කරු දෙපාර්තමේන්තුව මගින් වතු අධිකාරීවරුන් සහ සහකාර වතු අධිකාරීවරුන් සඳහා සම්මන්ත්‍රණ හා වැඩමුළු පවත්වනු ලැබිනි. කුසලතා සංවර්ධන පදනම මගින් සංවිධානය කළ වැඩමුළු සඳහා වතු අධිකාරිවරුන් හා ප්‍රධාන කාර්යාලයේ විධායක නිළධාරින් ද සහභාගී කරවන ලදී.

### ශ්‍රී ලංකා ජාතික කෘෂි ව්‍යාපාරික කවුන්සිලය විසින් ප්‍රදානය කළ 2014 ජාතික කෘෂි ව්‍යාපාරික සම්මානය.

2014 ජාතික කෘෂි ව්‍යාපාරික සම්මාන උළෙලේ දී 2013 වසරේ මධ්‍යම මට්ටමේ වැවිලි නිෂ්පාදන ආයතන අතරින් ලෝකඩ සම්මානය හලාවත වැවිලි සමාගමට හිමි විය.



පොල් වගා කර ඇති මුළු භූමි ප්‍රමාණය (හෙක්.)
2014 දෙසැම්බර් 31 අවසානයේ

| ප්‍රදේශය | පලුගස්වැව | දිවුලපිටිය | බිංගිරිය | හලාවත | මාදම්පේ | තම්බපන්නි | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ඵල දරන පොල් වගාව (හෙක්.) | 461.66 | 296.74 | 615.96 | 374.99 | 484.95 | 1225.23 | 3,459.53 |
| ඵල නොදරන නෙමේරූ පොල් (හෙක්.) | 155.50 | 107.00 | 389.93 | 110.37 | 118.70 | 123.09 | 1,004.59 |
| පොල් වගාකර ඇති මුළු භූමි ප්‍රමාණය (හෙක්.) | 617.16 | 403.74 | 1005.89 | 485.36 | 603.65 | 1,348.32 | 4,464.12 |




හලාවත වැවිලි සමාගමට අයත් පොල් වගාවල වයස් විශ්ලේෂණය - 2014 දෙසැම්බර් 31 අවසානයේ දී

| වයස් කාණ්ඩය | 50 වැඩි | 20 – 49 | 10 – 19 | 5 – 9 | 0 - 4 | එකතුව |
|---|---|---|---|---|---|---|
| ගස් ප්‍රමාණය | 152,544 | 208,997 | 41,979 | 28,711 | 121,374 | 553,605 |
| % - එකතුව | 28% | 38% | 8% | 5% | 22% | |



## වැසි දින හා වර්ෂාපතනය

ගතවූ වසර කිහිපය හා සන්සන්දනාත්මකව බලන විට මෙම වර්ෂයේ දී ඉහළ වර්ෂාපතනයක් සමග කාලගුණය යහපත් තත්වයට පත්වී ඇත.

| වත්තේ නම | 2014 ජන. - දෙසැ. වර්ෂාපතනය මිමි | 2014 ජන. - දෙසැ. වැසි දින | 2014 දෙසැ. වර්ෂාපතනය මිමි | 2014 දෙසැ. වැසි දින |
|---|---|---|---|---|
| බිංගිරිය | 1718 | 87 | 374 | 19 |
| හලාවත | 1536 | 72 | 349 | 20 |
| දිවුලපිටිය | 1765 | 95 | 394 | 18 |
| මාදම්පේ | 2200 | 70 | 372 | 15 |
| පලූගස්වැව | 1715 | 87 | 320 | 23 |
| තම්බපන්නි | 1674 | 84 | 380 | 20 |






### අත් පරාගනය

පොල් කර්මාන්තයට නිරෝගී හා ඉහළ ඵලදාවක් ඇති පොල් ගස් අවශ්‍යතාවයන් සහ වැදගත්කම අවබෝධ කර ගනිමින් වැඩි නිෂ්පාදනයක් සහ වැඩි ලාභයක් සඳහා ඉහළ ගුණාත්මක තත්වයෙන් යුතු බීජ හා පැළ අවශ්‍යතාව මූලිකම අවශ්‍යතාවයක් ලෙස හඳුනා ගන්නා ලදී. ඒ අනුව මෙහි ප්‍රථිපලයක් ලෙස නිරෝගී, වැඩි ඵලදාවක් සහ නියගයට ඔරොත්තු දෙන බීජ පැළ බිහිකර ගැනීම සඳහා අත් පරාගනය කිරීමේ කටයුතු දියත් කරන ලදී.

පලුගස්වැව වත්තේ පිහිටා ඇති අත් පරාගන ව්‍යාපෘතිය මගින් දෙමුහුන් බීජ සාර්ථක ලෙස නිපදවීමට හැකියාව ලැබිනි. එසේ ලබාගත් බීජ යොදා ගනිමින් සිදු කරන ලද යටි වගාවන්වල ඇති පැළ ශක්තිමත්ව ඉහළ වර්ධනයක් පෙන්වන අතර පරිසර සාධකයන්ට ඔරොත්තු දෙන ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳ සලකුණු පෙන්වයි.




### අත් පරාගනය මගින් ජානමය වශයෙන් උසස් තත්වයෙන් යුත් බීජ නිෂ්පාදනය

| වර්ෂය | සැන්රාමන් මල් | බීජ අස්වැන්න ගෙඩි ප්‍රමාණය | තවාන් කර ඇති බීජ ප්‍රමාණය |
|---|---|---|---|
| 2013 | 4,098 | 16,121 | 20,968 |
| 2014 | 1,976 | 17,452 | 17,112 |
| එකතුව | 6,074 | 33,573 | 38,080 |

### බීජ උයන

පොල් පර්යේෂණ ආයතනය හා හලාවත වැවිලි සමාගම අතර ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස කප්රුවන දෙමුහුන් බීජ උයන කිණියම වතු යායේ පවත්වා ගෙන යයි.
වැඩෙමින් පවතින පොල් පැළ මගින් ශක්තිමත් සාර්ථක ව්‍යාපෘතියක් බවට ලකුණු පෙන්වයි. (2012 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.)

### ආයෝජන ප්‍රමාණය

### නව වගා හා යටි වගා

සීමාසහිත හලාවත වැවිලි සමාගමේ ප්‍රධානතම ආයෝජනය වනුයේ නව වගාව හා යටි වගාව ය. මීට පෙර යටි වගා සහ නව වගාවන් කෙරෙහි නිසි අවධානයට ලක් නොවීම හේතුවෙන් මහා පරිමාණ නව වගා සහ යටි වගාවන් කෙරෙහි අවධානය යොමු කර ඇත. පොල් ගස් වලින් වැඩි ප්‍රමාණයක් වසර 50 ට වැඩි වන අතර එම ප්‍රමාණය මුළු වගාකර ඇති ගස් සංඛ්‍යාවෙන් 152,544 කි. එය සමස්ථ වගා කර ඇති ගස් ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් 28% ක් වේ. එබැවින් මේ වන විට ඒවායේ ඵලදායිතාව ඉතාමත් පහළ මට්ටමක පවතී. 2008 මැයි 31 දිනට පසුව හෙක්ටයාර් 939.09 ට වැඩි ප්‍රමාණයක් වගා කර ඇති අතර නව වගාව හා යටි වගාව ලෙස ආසන්න වශයෙන් පැල 141,368 සිටුවා ඇත. කළමනාකාරිත්වය රජය විසින් භාර ගැනීමෙන් පසුව මෙම ආයෝජන සිදු කර ඇත. ඉදිරි පස් වසරක කාලයක් තුල මෙම නව පැල හා යටි වගාවන් අස්වැන්න නෙලන තත්වයට පත් වනු ඇත.

31/12/2014 දිනට නව / යටි වගා සඳහා උපචිත ආයෝජන

| වත්ත | නව/ යටි වගා ප්‍රමාණය (හෙක්.) | 2014 දෙසැම්බර් අවසනට සමස්ත ආයෝජනය (රු.) |
|---|---|---|
| පලුගස්වැව වත්ත | 155.50 | 56,989,871.68 |
| හලාවත වතු කලාපය | 110.37 | 38,892,297.98 |
| දිවුලපිටිය වතු කලාපය | 107.00 | 34,098,188.79 |
| තම්පන්නි වතු කලාපය | 123.09 | 47,560,103.56 |
| බිංගිරිය වතු කලාපය | 389.93 | 119,766,800.09 |
| මාදම්පේ වතු කලාපය | 118.70 | 32,237,597.40 |
| එකතුව | 1004.59 | 329,544,859.50 |

## නව යටි වගා ප්‍රමාණය - 2005 සිට 2014 තෙක්




## හලාවත වැවිලි සමාගමේ යටි වගා හා නව වගා

| වසර | නව/ යටි වගා ප්‍රමාණය (හෙක්.) | බීජ ප්‍රමාණය |
|---|---|---|
| 2005 | 54.35 | 8,592 |
| 2006 | 44.50 | 7,791 |
| 2007 | 0 | 0 |
| 2008 | 33.94 | 5,566 |
| 2009 | 101.10 | 15,847 |
| 2010 | 107.93 | 17,689 |
| 2011 | 128.17 | 19,685 |
| 2012 | 269.62 | 37,495 |
| 2013 | 183.76 | 28,231 |
| 2014 | 114.57 | 16,855 |
| **එකතුව** | **1,037.94** | **157,751** |

## නව / යටි වගා හා බිම් ප්‍රමාණය - 2005 සිට



## අතුරුභෝග වගාව හා පශුසම්පත්

### මීගව ව්‍යාපෘතිය

පලුගස්වැව වත්තේ පිහිටා ඇත.
මී ගවයන් සංඛ්‍යාව - 419.
මී දෙනුන් සංඛ්‍යාව - 187.
මීකිරි හා යෝගට් බවට සැකසූ මුළු කිරි ප්‍රමාණය ලීටර් 45,075.04
කෘතිම සිංචනය පසුගිය වසරේ දි සිදු කරන ලද අතර ඉන් නව උපත් 5 ක් ලබා ගැනීමට හැකි විය.
නෙදර්ලන්ත නිලධාරීන්ගේ උපදෙස් වලට අනුව සත්ව නිවාස හා කිරි නිෂ්පාදන වල ප්‍රමිතිය ඉහළ දැමීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු වෙමින් පවති. කිරි දෙවීමේ යන්ත්‍ර සහිතව කිරි දොවන ස්ථානයක් ඉදිරියේ දී පිහිටුවීමට නියමිතය.

### බැටලු ව්‍යාපෘතිය

බිංගිරිය කලාප වතු - කිනියම වත්ත.
බැටලුවන් සංඛ්‍යාව - 925.
යටි වගා හා ඩ්‍රැගන් ෆෘට් වගා සඳහා බැටලු ගොම භාවිතා කෙරේ.





### රඹුටන් වගාව

දිවුලපිටිය වතු කලාපයට අයත් කෝපිවත්ත වතු යායේ පිහිටා ඇත.
1996 හා 2005 වසර වල ආරම්භ කෙරිනි.
මුළු ගස් ප්‍රමාණය - 590.
රඹුටන් ව්‍යාපෘතිය මගින් ලත් ආදායම රු. 343,000/- කි.

### ගම්මිරිස් වගාව

දිවුලපිටිය වතු කලාපයට අයත් වීරනිශ්ශංකමල්ල වත්තේ පිහිටා ඇත.
1998 හා 1999 වසරවල ආරම්භ කෙරිනි.
මුළු වැල් සංඛ්‍යාව - 1973
2014 වසරේ ලත් ආදායම රු. මිලියන 1.2 කි.

### කුරුදු වගාව

දිවුලපිටිය පළාත් වතුවලට අයත් දොඹවින්න හා සරස්වතී වතු වල පිහිටා ඇත.
2011 වසරේ දී ආරම්භ කෙරිනි.
පැල ප්‍රමාණය - 24,365.
උපයා ගත් ආදායම රු. 237,170/-.
කොළමුනුඔය වත්ත
අක්කර 1 - පැල 3600.
සියඹලාවැව වත්ත 2011 - පැල 3600.

**ඩ්‍රැගන් ෆෲට් වගාව**

2006 වසරේ දී බිංගිරියේ දී වගා කළ පැල ව්‍යාපෘතිය ස්ථිර ආදායමක් අත්කර දෙමින් අගනා ප්‍රතිඵල පෙන්වා ඇති අතර මේ සඳහා සිදුකළ සමස්ථ ආයෝජනය දැනටමත් උපයාගෙන ඇත. මෙම ව්‍යාපෘතිය වෙනත් වතු වල ද පහත දැක්වෙන අයුරින් ව්‍යාප්ත කර ඇත.

| වත්ත | සිටවූ වර්ෂය | පැල ප්‍රමාණය | ඵලදරන පැල සංඛ්‍යාව |
|---|---|---|---|
| පලුගස්වැව | 2011 | 50 | 50 |
| බිංගිරිය | 2008/2012 | 2700 | 450 |
| දීවුලපිටිය | 2011/2012 | 946 | 946 |
| මාදම්පේ | 2011/2012 | 550 | 50 |





සැකසීම, වැඩිදුරටත් සැකසීම හා වටිනාකම් එකතුකළ නිෂ්පාදන හා අලෙවිකරනය.

**කජු ව්‍යාපෘතිය**

තම්බපන්නි පළාත් වතු වල පිහිටා ඇති කජු සැකසීමේ මධ්‍යස්ථානය

තම්බපන්නි පළාත් වතු වල පිහිටා ඇති බද්ධ කජු පැල තවාන මගින් කජු වගාකරුවන්හට වැඩි අස්වැන්නක් ලබා දෙන පැල ලබා දීම අඛණ්ඩව සිදුවේ.

2014 වසරේ දී නෙලන ලද සමස්ත කජු ප්‍රමාණය කිලෝ 76,792.5 ක් වූ අතර, ලෙලි කජු සඳහා වෙලදපලේ සැලකිය යුතු මිලක් ලැබිනි. කජු අස්වැන්නෙන් කොටසක් තම්බපන්නි පළාත් වතු කජු සැකසුම් මධ්‍යස්ථානයේ සකස් කර නිමි භාණ්ඩයක් ලෙස පාරිභෝගිකයන්ට අලෙවි කර ඇත.

කජු ව්‍යාපාතියේ ලත් ආදායම රු. මිලියන 21ක් පමණ වූ අතර රු. මිලියන 6 ක පමණ ලාභයක් උපයන ලදී.

වැසි ජලය එක් රැස් කිරීම





**වැසි ජලය එක් රැස් කිරීම**

අවදානම් කළමනාකරන පියවරක් ලෙස හා පසේ තෙතමන ප්‍රතිශතය වර්ධනය කිරීම අරමුණු කොට වැසි ජල අස්වනු නෙලීම සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන ලදි. කලාප වතු හයේ ඇති වැව් වැඩිදියුණු කර මඩ ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇත.

# මූල්‍ය සමාලෝචනය

### සමාගමේ මූල්‍ය කාර්ය සාධනය ලුහුඬින්

| | 2014 | 2013 | විචලනය | විචලනය % | රු. මිලි<br>ප්‍රධාන සාධක |
|---|---|---|---|---|---|
| පොල් ගෙඩි මිලියන | 12.9 | 9.5 | 3.4 | 35% | |
| ආදායම | 375 | 287 | 88 | 30% | අස්වැන්න 35% කින් වැඩි වී ඇත |
| අලෙවි පිරිවැය | 222 | 174 | 48 | 27% | වසර තුල මේරු වගාව සඳහා පොහොර යෙදීමේ පිරිවැය වැඩි වීම හේතුවෙන් |
| වෙනත් ආදායම් | 37 | 76 | (39) | (51%) | වෙනත් මෙහෙයුම් ආදායම පහළ ගොස් ඇත |
| පරිපාලන වියදම් | 104 | 93 | 11 | 11.8% | දිරිදීමනා හා වැටුප් ගෙවීම ඉහළ ගොස් ඇත |
| වෙනත් මෙහෙයුම් වියදම් | 9 | 9 | | | |
| මූල්‍ය ආදායම | 11 | 21 | (10) | (48%) | තැන්පතු සඳහා වූ අඩු පොළී අනුපාතික සහ නව වගාව සඳහා ආයෝජනය කිරීම ඉහළ යාම හේතුවෙන් ස්ථාවර තැන්පතු ශේෂය පහල ගොස් ඇත |
| මූල්‍ය පිරිවැය | 29 | 27 | 2 | 7% | වාර්ෂික ද. දේ. නි. අවධමනය ඉහළයාම හේතුවෙන් වත්කම් වල කල්බදු කුළිය ඉහළ යාම |

### මූල්‍ය කාර්ය සාධනය

#### අයභාරය

පසුගිය වසරේ උපයාගත් රු.මිලියන 278 ක අයභාරයට සාපේක්ෂව 2014 වර්ෂයේ රු.මිලියන 374.8 ක අයභාරයක් උපයාගෙන ඇත. මෙය සංසන්දනාත්මකව ගත්කල රු. මිලියන 88 ක වැඩිවීමකි. මෙම වර්ෂයේ පොල් ඵලදාවේ වැඩිවීම මෙම සතුටුදායක වෙනසට හේතු විය. 2013 වර්ෂයේ ලබා ගත් පොල් අස්වැන්න පොල් ගෙඩි 9,595,315 වූ අතර 2014 වර්ෂයේ දී එය ගෙඩි 12,969,381 ලෙස පසුගිය වසරට සාපේක්ෂව 35% කින් වැඩි වී ඇත.




#### විකුණුම් පිරිවැය

සමාලෝචිත වර්ෂය තුල විකුණුම් පිරිවැය රු. මිලියන 222 ක් වේ. එය පසුගිය වසරට සාපේක්ෂව ගත්කල රු.මිලියන 48 ක වැඩි වීමකි. මෙම පිරිවැය වැඩිවීම කෙරෙහි බලපෑ ප්‍රධාන හේතු පහත පරිදි විස්තර කල හැක.

- මේරු වගාව සඳහා පොහොර යෙදීම වෙනුවෙන් දැරූ පිරිවැය 2013 වර්ෂයේ රු.මිලියන 13 සිට 2014 වර්ෂයේ දී රු. මිලියන 36 ක් දක්වා වැඩි විය. 2013 වර්ෂයේ අවසන් කාර්තුවේ පැවති අහිතකර කාළගුණික තත්වය නිසා පොහොර යෙදීම සීමාකාරී ප්‍රදේශයකට පමණක් සිදුකිරීම මත දැරූ පිරිවැය අඩු විය.

- පඩිපාලක සභාව විසින් කම්කරු වැටුප් ප්‍රතිශෝධනය කිරීම නිසා කම්කරු වැටුප් 15% කින් වැඩි විය. එය 2013 වර්ෂයේ රු.මිලියන 87 ක් වූ අතර 2014 එය රු. මිලියන 100 ක් විය.

- ලංකා වතු සේවක සංගමය හා හලාවත වැවිලි සමාගම අතර ඇතිකර ගත් නව සාමූහික ගිවිසුමට අනුව වතු සේවක වැටුප් සංශෝධනය හා කළමනාකරණ සේවා චක්‍රලේඛන වලට අනුව වතු විධායක නිළධාරීන්ගේ වැටුප් වැඩි වීම මත පසුගිය වසරට වඩා රු.මිලියන 3 ක අමතර වියදමක් මෙම වර්ෂයේ දරන ලදි.

- වතු සේවක නිවාස සඳහා මූලික හා අත්‍යවශ්‍ය සාධකයක් වන විදුලිය සැපයීම වෙනුවෙන් 2014 වර්ෂය තුල රු.මිලියන 3.2 ක් වැය කර ඇත.

- සේවක වැටුප් සංශෝධනය මත පදනම්ව පසුගිය සේවාකාලය වෙනුවෙන් සේවක පාරිතෝෂික වෙන් කිරීම් සඳහා රු.මිලියන 3.5 ක් ගැළපුම් කරන ලදී.

- අනෙකුත් ක්ෂේත්‍ර කටයුතු එනම්, සී සෑම්, වල් නෙලීම්, කානු කැපීම්, වැව් පිළිසකර කිරීම, පාලු සිටුවීම, පොල් ලෙලි වැලලීම වෙනුවෙන් දරන ලද වියදම් වැඩි වී ඇත.

### අනෙකුත් මෙහෙයුම් ආදායම

අනෙකුත් මෙහෙයුම් ආදායම වන කජු, පොල් ලෙලි, දව ගස්, පශු සම්පත්, මැරුණු වැටුණු පොල් ගස් අලෙවිය හා කුඹුරු තුලින් උපයා ගත් ආදායම පසුගිය වසරට සාපේක්ෂව රු.මිලියන 76 සිට රු.මිලියන 37 දක්වා අඩු වී ඇත.

පසුගිය වර්ෂය තුල සමාගම රු.මිලියන 18.5 ක් දව ගස් අලෙවියෙන් ද රු.මිලියන 15.6 භාවිතයෙන් ඉවත් කල වාහන අලෙවියෙන් ද උපයන ලදි. නමුත් 2014 වර්ෂයේ දී භාවිතයෙන් ඉවත් කල වාහන වෙන්දේසියක් සිදු නොවූ අතර වටිනා දැවගස් අලෙවිය තුලින් ආදායම් උපයා නොමැත. පසුගිය වර්ෂයට සාපේක්ෂව අනෙකුත් මෙහෙයුම් ආදායම් අඩුවීම කෙරෙහි එම සාධක ප්‍රධාන වශයෙන් බලපෑ ඇත.

### පරිපාලන වියදම්

පහත සඳහන් හේතූන් මත පරිපාලන වියදම පසුගිය වසරට සාපේක්ෂව රු.මිලියන 12 කින් වැඩි වී ඇත.

- සේවක ප්‍රසාද දීමනා ලෙස පසුගිය වර්ෂයේ ගෙවූ රු.මිලියන 11.6 ට සාපේක්ෂව 2014 වර්ෂයේ දී රු.මිලියන 13.5 ක් සියලු සේවකයින් වෙත ලබා දෙන ලදි.
- 2013 වර්ෂයේ මිලදී ගත් ප්‍රාග්ධන වත්කම් මත 2014 වර්ෂයේ දී ක්ෂය සඳහා වෙන් කිරීම රු.මිලියන 3.1 කින් වැඩි වී ඇත.
- සේවකයින් 09 දෙනෙකු විධායක ශ්‍රේණි සඳහා උසස් වීම් ලැබීම හා කළමනාකරණ සේවා චක්‍රලේඛවලට අනුව විධායක හා විධායක නොවන කාර්ය මණ්ඩල වැටුප් වැඩිවීම මත 2014 වර්ෂයේදී වැටුප් හා දීමනා වෙනුවෙන් රු.මිලියන 3.5 ක අමතර පිරිවැයක් දැරීමට සිදුවිය.

### මූල්‍ය ආදායම

ස්ථාවර තැම්පතු මත උපයන ලද පොලී ආදායම මූල්‍ය ආදායම ලෙස දක්වේ.

### ශුද්ධ මූල්‍ය පිරිවැය

ජනවසම කල්බදු වත්කම මත ගෙවූ පොළිය හා අසම්භාව්‍ය බදුකුලිය මූල්‍ය පිරිවැය තුලින් දක්වයි. දළ දේශීය නිෂ්පාදන අවධමනකයට අනුව කල්බදු වත්කම් මත රජයට ගෙවූ බදු පොළිය පසුගිය වර්ෂයේ ගෙවන ලද රු. මිලියන 27 ට සාපේක්ෂව රු.මිලියන 29 දක්වා, 7% කින් වැඩි වී ඇත.




### මූල්‍ය වත්කම් මත හානිකරන අලාභය හා ශුද්ධ ලාභ රු. (අලාභ)

2010 වර්ෂයේ දී රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ හිටපු ලේකම් තුමාගේ උපදෙස් මත සමාගම විසින් රු.මිලියන 105 ක මුදලක් රජයට අයත් රාජ්‍ය ආයතන වෙත කෙටි කාලීන ණය පහසුකම් ලෙස ලබා දී ඇත.

කෙසේ වෙතත් නිරන්තර සිහිකැඳවීම් කල ද අදාල පාර්ශවයන් විසින් ණය මුදල හෝ ණය මුදල මත සමුචිත පොලිය මත රු. 14,757,808.21 ක මුදල 2014 දෙසැම්බර් 31 දිනය වන විටත් ගෙවා නොතිබුණි.

ඉහත කරුණු සලකා බැලීමෙන් පසු හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම අගය මත හානිකරන අලාභ සඳහා 2014 වර්ෂයේ ගිණුම් වාර්තාවල ප්‍රතිපාදන වෙන් කිරීමට තීරණය කරන ලදි. ලබා දී ඇති මූල්‍ය පහසුකම් වෙනුවෙන් හානි කරන අලාභය සඳහා රු.මිලියන 119.7 ක අඩමාන ණය සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමෙන් පසු 2014 වර්ෂය වෙනුවෙන් ශුද්ධ අලාභය රු.මිලියන 61.6 විය.

### ලාභාංශ

බොහෝ රාජ්‍ය ආයතන රජයේ මුදල් මත යැපෙමින් සිටී. එහෙත් හලාවත වැවිලි සමාගම එහි කළමනාකාරිත්වය 2008 මැයි මස නැවත රජයට පවරා ගැනීමෙන් පසුව ස්වර්ණමය කොටස් හිමිකරු වන මහා භාණ්ඩාගාරය වෙත රු.මිලියන 235 ක මුදලක් ලාභාංශ ලෙස ගෙවා ඇත. 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුල උපයන ලද ලාභය සමග ගත්කල මෙය සැලකිය යුතු ඉහළ වටිනාකමකි. 2013 වර්ෂය අවසන් වන විට හලාවත වැවිලි සමාගම විසින් ගෙවන ලද මුලු ලාභාංශ ප්‍රමාණය රු.මිලියන 396 කි.

### මුදල් ප්‍රවාහය

පසුගිය වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.මිලියන 117 ට සාපේක්ෂව මෙම වර්ෂයේ දී රු.මිලියන 98 කි.

සමාලෝචිත වර්ෂය තුල සමාගම නව වගා හා යටි වගා සංවර්ධනය වෙනුවෙන් රු.මිලියන 89 ආයෝජනය කල අතර රු. මිලියන 7 ක් දේපල, පිරියත හා උපකරණ වෙනුවෙන් ආයෝජනය කර ඇත. ආයෝජන කටයුතුවලින් සෘණ මුදල් ප්‍රවාහයක් ජනනය වීමට මෙය හේතු සාධක වී ඇත.

2014 වර්ෂය තුලදී සමාගම රු.මිලියන 20 ක මුදලක් ලාභාංශ ලෙස මහා භාණ්ඩාගාරය / ස්වර්ණමය කොටස් හිමිකරු වෙත ගෙවීම මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇත.

කෙසේ වෙතත් වර්ෂය අවසන් වන විට රු.මිලියන 116 ක් මුදල් හා මුදල් සමාන දෑ ලෙස පැවති අතර ඒවා ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් හා මුදල් හා බැංකු ශේෂයෙන් සමන්විත වේ.

**කොටසක ඉපයීම**

පසුගිය වසරේ කොටසක ඉපයීම රු. 3.69 ට සාපේක්ෂව 2014 වර්ෂයේ රු. (3.10) වේ.

**ජංගම අනුපාතය**

ජංගම අනුපාතය 4.09 වීම සමාගමට කෙටිකාලීන ද්‍රවශීලතා අවශ්‍යතාවය ඉටුකර ගැනීමට ඇති හැකියාව පිළිබඳව ප්‍රමාණාත්මක මට්ටමක් පෙන්නුම් කරයි.

**වත්කම් සමුදාය**

මූල්‍ය වර්ෂය අවසානයට සමාගමේ වත්කම් සමුදාය රු.මිලියන 1026 කි.

| **වත්කම් සමුදාය** | **2014 රු.මිලියන** | **2013 රු.මිලියන** |
|---|---|---|
| ජනවසම වතුවල හිස් භූමි වල කල්බදු හිමිකම | 82 | 84 |
| ජනවසම කල්බදු දේපළල පිරියත හා උපකරණ හිමිකම | 4 | 4 |
| ජනවසම වතුයායන් වල ජෛව වත්කම් වල කල්බදු හිමිකම | 37 | 41 |
| ජෛව වත්කම් (කල්බදු ජෛව වත්කම් හැර) | 552 | 470 |
| සින්නක්කර දේපල පිරියත හා උපකරණ හිමිකම | 118 | 137 |
| ජංගම වත්කම් | 233 | 356 |
| මුළු වත්කම | 1,026 | 1093 |

නව සහ යටි වගාවන් වෙනුවෙන් ප්‍රාග්ධන ආයෝජනය

2014 වර්ෂය තුල නව වගාවන් / යටි වගාවන් සහ නොමේරූ වගා කළමනාකරණය වෙනුවෙන් හෙක්ටයාර 1005 ක් සඳහා රු.මිලියන 84 ආයෝජනය කර ඇත. ඊට අමතරව වර්ෂය තුල අනෙකුත් බහු වාර්ෂික බෝග වෙනුවෙන් රු.මිලියන 5 ක් සමාගම විසින් ආයෝජනය කර ඇත.



**පොල් නිෂ්පාදනය**
**ශු.වි.සා. සහ අයභාරය ( 2009 - 2014)**

| වර්ෂය | පොල් ගෙඩි | ශු.වි.සා. 1000 ට | අයභාරය |
|---|---|---|---|
| 2009 | 18,632,247 | 16,782 | 312,686,690 |
| 2010 | 18,256,007 | 23,152 | 422,668,428 |
| 2011 | 14,527,770 | 22,227 | 322,908,950 |
| 2012 | 15,807,753 | 21,448 | 339,050,649 |
| 2013 | 9,595,315 | 29,926 | 287,152,154 |
| 2014 | 12,969,381 | 27,903 | 374,850,643 |

**2014 වර්ෂයේ වතුවල අස්වැන්න**

| වත්ත | අස්වැන්න (ගෙඩි) |
|---|---|
| හලාවත | 1,735,100 |
| පලුගස්වැව | 3,639,284 |
| තම්බපන්නි | 1,659,753 |
| බිංගිරිය | 2,323,000 |
| දිවුලපිටිය | 1,750,693 |
| මාදම්පේ | 1,861,551 |
| එකතුව | **12,969,381** |






# අධ්‍යක්ෂ මණ්ඩලයේ සංක්ෂිප්ත වාර්තාව

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමග වාර්ෂික වාර්ථාව හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

**සාරාංශගත ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශය ඃ**

| | 31.12.2014 න් අවසන් වසර සඳහා (රු.) | 31.12.2013 න් අවසන් වසර සඳහා (රු.) |
|---|---|---|
| **පොල් නිෂ්පාදනය (ගෙඩි)** | **12,969,381** | **9,595,315** |
| අයභාරය | 374,850,643 | 287,152,154 |
| අලෙවි පිරිවැය | (222,124,184) | (174,262,628) |
| **දළ ලාභය** | **152,726,458** | **112,889,525** |
| වෙනත් මෙහෙයුම් ආදායම සහ ඉපයීම් | 37,371,708 | 76,206,174 |
| පරිපාලන වියදම් | (104,412,082) | (92,660,057) |
| වෙනත් මෙහෙයුම් වියදම් | (9,199,104) | (8,613,780) |
| **මෙහෙයුම් වලින් ලාභය** | **76,486,980** | **87,821,863** |
| මූල්‍ය අදායම් | 11,304,731 | 21,167,854 |
| මූල්‍ය වියදම් | (29,306,794) | (27,169,196) |
| මූල්‍ය වත්කම් හානිකරණය | (119,757,808) | |
| **බදුපෙර ලාභය** | **(61,272,891)** | **81,820,521** |
| බදු වියදම් | (799,013) | (8,072,974) |
| **වසරේ ලාභය/(ශුද්ධ පාඩුව)** | **(62,071,904)** | **73,747,547** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | 391,711 | (828,622) |
| **වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම් බදු පසු** | **(61,680,193)** | **72,918,925** |
| මූලික කොටසක ඉපයීම් | (3.10) | 3.69 |
| **කොටස් ප්‍රාග්ධනය** | **200,000,010** | **200,000,010** |

### ප්‍රධාන ක්‍රියාකාරකම්

ප්‍රධාන වැවිලි භෝගය ලෙස පොල් සහ වෙනත් කෘෂි භෝග වගාකිරිම අගය එකතු කල භාණ්ඩ නිශ්පාදනය, පශු සම්පත් හා නිශ්පාදන අලෙවි කිරිම.

### මූල්‍ය වාර්ථා

සමාගමේ මූල්‍ය වාර්ථා පිටු අංක 28 - 53 සදහන්ව ඇත.

### විගණන වාර්ථාව

සමාගමේ විගණන වාර්ථාව පිටු අංක 27 සදහන්ව ඇත.

### ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියල කිරීමේදි යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මේ සමග අමුණා ඇති අතර පසුගිය වසර හා සංසන්දනය කිරීමේදී වෙනසක් සිදු කර නොමැත.

### අඛණ්ඩ පැවැත්ම

සමාගමේ කටයුතු පුරෝකථනය කල හැකි අනාගතයක් සදහා ඉදිරියට පවත්වා ගෙනයාම සඳහා අවශ්‍ය තරම් සම්පත් සමාගම සතුව ඇති බවට අධ්‍යක්‍ෂ මණ්ඩලය සෑහීමට පත්ව ඇත. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශන "අඛණ්ඩ බව" යන සංකල්පය මත සකසා ඇත.

### අධ්‍යක්‍ෂ මණ්ඩලය

ආයතනයෙහි අධ්‍යක්‍ෂ මණ්ඩලය සංක්ෂිප්ත ව පහත පරිදි වේ. මේ පිළිබඳ පූර්ණ විස්තර අධ්‍යක්‍ෂ මණ්ඩලය ශීර්ෂය යටතේ මෙයට ඉහත දක්වා ඇත.

### වත්මන් අධ්‍යක්‍ෂ මණ්ඩලය

පණ්ඩුක ජයසිංහ මහතා (01/01/2014 සිට 27/11/2014)
සභාපති/ ප්‍ර.වි.නිළධාරී සහ සාමාජික

ගාමිණි රාජකරුණා මහතා (27/11/2014 සිට 31/12/2014)
සභාපති/ ප්‍ර.වි.නිළධාරී සහ සාමාජික

ඒ. එම්. චන්ද්‍රපාල මහතා
විධායක අධ්‍යක්‍ෂ සහ සාමාජික

ඔ. පි. පි. පතිරණගේ මහතා
ක්‍රියාකාරි අධ්‍යක්‍ෂ සහ සාමාජික

ප්‍රියංගනි ලියනගේ මහත්මිය
මහා භාණ්ඩාගාර නියෝජිත සහ සාමාජික

| | |
|---|---|
| එස්. චන්ද්‍රා එස්. ප්‍රනාන්දු මහතා | සාමාජික |
| අයි. එම්. ආර්. විදානගමගේ මහතා | සාමාජික |
| කේ. බි. රත්නායක මහතා | සාමාජික |
| ආර්. ආර්. එම්. අමරතුංග මහතා | සාමාජික |

### විගණන කමිටුව

පහත සඳහන් අධ්‍යක්‍ෂවරුන් විගණන කමිටුව නියෝජනය කළ අතර වසර තුළ ඇගයීම් 05 ක් සිදු කරන ලදී.

### වත්මන් විගණන කමිටුව

| | |
|---|---|
| ආර්. ආර්. එම්. අමරතුංග මහතා | සභාපති |
| ප්‍රියංගනි ලියනගේ මහත්මිය | මහා භාණ්ඩාගාර නියෝජිත සහ සාමාජික |
| කේ. බි. රත්නායක මහතා | සාමාජික |
| අයි. එම්. ආර්. විදානගමගේ මහතා | සාමාජික |
| ඒ. එම්. චන්ද්‍රපාල මහතා | නිරීක්ෂක |

### ප්‍රගති සමාලෝචනය

වර්ෂය තුල සමාගමේ ප්‍රගතිය පිළිබඳ වාර්තා සහ වැදගත් කළමනාකරණ සහ සංවර්ධන ව්‍යාපෘති පිළිබද විස්තර සභාපතිතුමාගේ හා කළමනාකරණ විමර්ශනයන් හි අඩංගුවේ.

### අයභාරය

වසර තුල සමාගමේ අයභාරය රුපියල් මිලියන 375 ක් වූ අතර විස්තර විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වල දක්වේ.

මූල්‍ය වත්කම්වල හානිකරන අලාභය හා මූල්‍ය ප්‍රථිඵල 2010 වර්ෂයේදි එවකට පැවති රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශ ලේකම් තුමාගේ උපදෙස් පරිදි හලාවත වැවිලි සමාගම විසින් රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය ඇතුලු රාජ්‍ය ආයතන වෙත රු. මිලියන 105 ක මුදලක් කෙටිකාලීන ණය ලෙස ලබා දි ඇත. කෙසේ වෙතත් එම ආයතන වෙත තිරන්තර සිහි කැදවීම් කලද ණය මුදල් හා ඊට අදාල පොලිය 2014 වර්ෂය අවසන් වන විටත් ගෙවා නොතිබිනි.

මෙම කරුණු සලකා බලා අධ්‍යක්‍ෂක මණ්ඩලය විසින් එම අය නොවී ඇති ණය මුදල් හා පොලිය වෙනුවෙන් රුපියල් මිලියන 119.7 අඩමාන ණය ප්‍රතිපාදනයක් 2014 වර්ෂයේ ගිණුම් මත සිදුකිරිමට තීරණය කරන ලදි.

මූල්‍ය වත්කම් හානිකරනය වෙනුවෙන් රුපියල් මිලියන 119.7 ක අඩමාන ණය ප්‍රතිපාදනය කිරිමෙන් පසු 2014 වර්ෂය සඳහා ශුද්ධ අලාභය රුපියල් මිලියන 61.6 ක් විය.

### ප්‍රාග්ධනය ස්ථාවර වත්කම්

2014 වර්ෂයේදී සමාගම රුපියල් මිලියන 96 ක් (2013 දී රු.මි. 166 ක්) ස්ථාවර වත්කම් වෙනුවෙන් ආයෝජනය කරන ලදී. ඉන් රු.මි. 89 ක් නව වගාවන්, යටි වගාවන් හා නොමේරූ වගා වෙනුවෙන්ද රු.මි. 7 ක් දේපල පිරියත උපකරන වෙනුවෙන්ද විය.

2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රට අනුව ජංගම නොවන වත්කම් (දේපල, ජෛව වත්කම්, පිරියත) වල පොත් අගය රුපියල් මිලියන 792 කි. විස්තර විගණන මුල්‍ය වාර්තාවේ දක්වා ඇත. (2013 එය රු.මි. 737 කි)

### කෙටි කාලීන ආයෝජන

2013 වර්ෂයේ රු. මි. 129 ට සාපේක්ෂව 2014 වර්ෂයේ සමාගමේ කෙටිකාලීන ආයෝජනය රු. මි. 113 ක් විය. එසේ අඩුවීමට හේතු ලෙස කෙටි කාලීන ආයෝජන යොදා ගැනිම, නව වගාවලට සහ ජංගම නොවන වත්කම් වලට කළ ප්‍රාග්ධන ආයෝජන හා මහා භාණ්ඩාගාරයට ලාභාංශ ලෙස රු.මි. 20 ක් ගෙවිම දැක්විය හැක.

### සංචිත

සමාගමේ ඇති සම්පූර්ණ සංචිත සමුච්චිත ලාභයෙන් දක්වේ. එය 2014 දෙසැම්බර් 31 වැනි දිනට රු. මිලියන 544 ක් වන අතර ඊට සාපේක්ෂව 2014 දී රු. මිලියන 625 ක් විය. සංචිත වල වෙනස් විම් සහ සංයුතිය විගණිත මුල්‍ය වාර්ථාවල ස්කන්ධ වෙනස් විම් ප්‍රකාශනයෙන් දැක්වේ.

### කොටස් ප්‍රාග්ධනය

2014 දෙසැම්බර් මස 31 වැනි දිනට සමාගමේ සමස්ත කොටස් ප්‍රාග්ධනය රුපියල් 200,000,010 ක් විය. සමාන්‍ය කොටස් 20,000,000 කින් සහ එක් ස්වර්ණමය කොටසකින් සමන්විත විය. කිසිදු ආකාරයක කොටස් නිකුත් කිරීමක් 2014 වසර තුළ සිදු කර නැත.

### වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම්

අසම්භාව්‍ය වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම් විගණන වාර්තාවේ සටහන් වල අන්තර්ගත කර ඇත.

### මුල්‍ය වාර්තාව ඉදිරිපත් කරන දිනට පසු සිදුවීම්

මුල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනයේ සිට මෙම වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන අවස්ථාව දක්වා ගිණුම් ප්‍රකාශන සංශෝධනය කිරීමට හෝ එසේ නැතහොත් ඒ තුල ගැලපීම් හෝ අනාවරණය කිරීමට හෝ අවශ්‍ය තරම් ප්‍රමාණවත් සිද්ධි සිදු වී නොමැත.

### අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම්

සමාගමේ ගිණුම් වාර්ථාවල සටහන් වල ප්‍රකාශ කර ඇති බැඳීම් හැර අධ්‍යක්ෂවරුන්ගේ වෙනත් බැඳීම් නොමැත.

### අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමිකම්

කිසිම අධ්‍යක්ෂවරයෙක් හෝ ඔහුගේ/ඇයගේ කාලත්‍රයෙකු සමාගමේ කොටස් හිමිකම් දරන්නේ නැත.

### සේවා නියුක්තිය

සමාගමේ තිරසාර උන්නතිය සඳහා, රජයේ නීති වලට අනුකූලව, සේවා සැපයීම, පුහුණුව, උසස්වීම්, විනයානුකූල තීරණ ආදී කරුණු සම්බන්ධව සියලුම සේවකයින්ට එක හා සමානව සලකනු ලබයි. එසේම, සමාගම සම තත්ව පදනම මූලික කර ගනිමින් සෑම සේවානියුක්තිකයකුට, ලිංග බේදය, ජාති බේදය, ආගම, විවාහක තත්ත්වය, දේශපාලන පසුබිම හෝ කායික දුබලතාවන් නොසලකා සම අවස්ථාවන් ලබා දීමට කටයුතු කරනු ලබයි.

### ව්‍යවස්ථාපිත දීමනා

සමාගම විසින් මුල්‍ය වාර්තා ඉදිරිපත් කරන දිනට ගෙවීමට නියමිත දන්නා සියලුම බදු සහ සමාගමේ සේවා නියුක්තියන් සඳහා ගෙවිය යුතු ගෙවීම් සහ සමාගම විසින් ගෙවිය යුතු අනෙකුත් දන්නා ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා අවසන් කර ඇති බවට හෝ ගෙවීම් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන ඇතිකර ඇති බවට හෝ අධ්‍යක්ෂවරුන් සහතික වේ.

### විගණකවරු

2014 වසර සඳහා වූ ගිණුම් අයියර් සහ සමාගම (වරලත් ගණකාධිකාරිවරු) විසින් විගණනය කරන ලදී.

### වාර්ෂික වාර්තාව

මුල්‍ය වාර්තා 2015 ජුලි මස 30 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### වාර්ෂික මහා සභා රැස්වීම

හලාවත වැවිලි සමාගමේ වාර්ෂික මහා සභා රැස්වීම 2015 ඔක්තෝබර් මස 20 වන දින, පස්වරු 1.30 ට, කොළඹ 01 ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලයේදි පැවැත්වීමට නියමිතය, මහා සභා රැස්වීමේ නිවේදනය සහ පෙරකලාසි පෝරමය මේ සමග අමුණා ඇත. මෙම වාර්තාව හලාවත වැවිලි සමගාමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදී.

රවින්ද්‍ර හේරත්
සභාපති/ප්‍රධාන විධායක නිලධාරි

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පුද්) සමාගම
ලේකම්වරු - හලාවත වැවිලි සමාගම
කොළඹ.

# අවදානම් කළමනාකරණය

කාලගුණික තත්ත්වයන් මත නිෂ්පාදනය අඩු වීම හා අඩු මිල හා අඩු අලෙවිය හේතුවෙන් විකුණුම් අඩු වීම ආදී අහිතකර බලපෑම් ඇති කරනු ලබන අවදානම් සාධක ක්ෂේත්‍ර හතරක් හඳුනා ගෙන ඇති අතර අනෙකුත් කරුණු ද වරින් වර හානිකර ලෙස බලපෑම් කරනු ලැබේ.

**යෝජිත පාලන ක්‍රමෝපායන්:**

| අවදානම් සාධකය | අවදානම් ඇගයීම | අවදානම් පාලන ක්‍රමෝපායන |
|---|---|---|
| නිෂ්පාදනය අඩු වීම | ප්‍රධාන වශයෙන් මාස ගණනක් අඛණ්ඩව පවතින නියඟය හේතුවේ.<br><br>අවුරුදු 50කට වැඩි පරිණත පොල් ගස් වැඩි ප්‍රතිශතයක් දිරාපත්වීම තවත් හේතුවක් වේ. | වගාවේ පස් අතර වර්ෂා ජලය රඳවා තබා ගැනීම සඳහා විශාල අගල් කපා පොල් ලෙලි වළලා පසේ තෙතමනය වැඩි කර ගැනීමට කටයුතු කිරීම, ගිනිසීරියා, පියුරේරියා වැනි ආවරණ බෝග වැවීම.<br><br>පසු කාලීනව වාරි සම්පාදනය සඳහා භාවිතා කිරීමට හා පොල් ගස් මුල් පෝෂණය කිරීමට උපකාරී විය හැකි වර්ෂා ජලය එක්රැස් කර ගැනීම සඳහා වැව් වැඩි සංඛ්‍යාවක් පිළිසකර කිරීම.<br><br>නව වගාව හා යටි වගාව සඳහා මහා පරිමාණයෙන් ආයෝජනය කිරීම. |
| භාණ්ඩ වෙළඳ චක්‍රය | පාරිභෝගික ඉල්ලුම මත පාදකව මිල හා විකුණුම් අස්ථාවර හා අඩුවීම හේතුවෙන් අලෙවිය බිඳ වැටීම මඟින් කොප්පරා නිශ්පාදනයට යොමු කිරීමෙන් පසු ඉතිරි පොල් ප්‍රමාණයක් විනාශ වීම.<br><br>අඩු පිරිවැය හේතුවෙන් පාරිභෝගිකයින් වැඩි වශයෙන් ආකර්ෂණය වන පාම් තෙල් වැනි ආදේශක තිබීම. | පොල් සංවර්ධන අධිකාරියේ වෙන්දේසියට අමතරව ප්‍රධාන කාර්යාලයේ සෑම සති දෙකකටම වරක් පවත්වනු ලබන 'පොල් පොළේ' දී පොල් අලෙවි කිරීම.<br><br>පොල් ගෙඩි ඉහළ ගුණාත්මක තත්ත්වයේ කොප්පරා බවට පත් කරනු ලබන අතර එයින් කොටසක් වෙන්දේසි කිරීම ද වැඩි කොටස පලුගස්වැව තෙල් මෝලේ දී පොල් තෙල් නිෂ්පාදනයට හා මිල යහපත් කාලයේ දී අලෙවි කිරීමට ගබඩා කරනු ලැබේ. |
| ණය අවදානම | ගැනුම්කරුවන් විසින් ඉතිරි මුදල් පියවීමට ප්‍රමාදවීම හෝ රීති හා රෙගුලාසි පිළිපැදීමට අසමත්වීමේ හැකියාවක් ඇත. | ණය පියවීමට හා පියවීමේ ක්‍රියාවලිය සමාලෝචනයට බලයලත් අධිකාරි ආයතන මැදිහත් කරවා ගැනීම. |
| කළමනාකරණ කාර්ය මණ්ඩලය | පුහුණුව අභිප්‍රේරණය නොමැති වීම නිසා අඩු නිමැවුම සේවකයින් වඩාත් හොඳ වේතන හා ඉහළ තනතුරු සඳහා වෙනත් කර්මාන්ත හෝ සමාගම් වෙත යාම. | වැඩමුළු හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>හැකිතාක් දුරට ආයතන තුළ ඉහළ තනතුරු සඳහා උසස්වීම් ලැබෙන බවට තහවුරු කිරීම. |

# ආයතනික පාලන ප්‍රකාශනය

හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය අවංකත්වය, ආයතනික මධ්‍යස්ථභාවය, විනිවිදභාවය හා වගකීම් සහගත බව යන ප්‍රතිපත්ති තුල ක්‍රියා කරනු ලබයි. මෙය සමාගම සහ සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන පිරිස් සමග ප්‍රබල සම්බන්ධතාවක් ඇති කිරීම සඳහා හේතු වී ඇත. ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන් සහ ආයතනික ස්ථායිතාව මෙන්ම ව්‍යාපාරික වටිනාකම වැඩිවන අයුරින් සකස්කර ඇති ප්‍රතිපත්තීන්, ක්‍රියාපටිපාටීන්, ක්‍රියා පිළිවෙත්, නිවැරදි ව්‍යුහයන් සහ තොරතුරු උක්ත සඳහන් සම්බන්ධතාවයන් වඩාත් සවිමත් කිරිම සඳහා හේතු වී ඇත.

### අධ්‍යක්ෂ මණ්ඩලය

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ කාර්යසාධනය සඳහා වගකිවයුතු වන්නාසේම අවසාන වශයෙන් ඒ සම්බන්ධයෙන් වගකීමට බැඳී සිටින්නේය.

### වගකීම

මූලික ප්‍රතිපත්තීන් හා උපායශිලී අරමුණු සකස් කිරිමටත් ඒවා ක්‍රියාවට නැංවීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටි. සමාගමේ මූල්‍ය තොරතුරුවල විශ්වාසනීයත්වය සහ අභ්‍යන්තරික පාලන ක්‍රමවේදයන්ගේ සාර්ථකත්වය සඳහාද අවසාන වගකීම් දරන්නා වන්නේ එහි අධ්‍යක්ෂ මණ්ඩලයයි.

### සංයුතිය

සභාපති සහ විධායක අධ්‍යක්ෂවරයෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලය 2014 වර්ෂයේ අධ්‍යක්ෂවරුන් අට දෙනෙකුගෙන් යුක්ත වේ.

### අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 2014 වසර මුලදී සම්පාදනය කළ වාර්ෂික සිද්ධි කාල රාමුවට අනුකූලව මාසිකව පවත්වනු ලබයි. සමාගමේ උපායශීලී ක්‍රමෝපායන්, වාර්ෂික අයවැය, සියලු කාර්යයන් වල ප්‍රගතිය, ප්‍රාග්ධන හා මූලධන වියදම් විමසීමට ලක් කිරීම මෙම රැස්වීමේදී සිදු වේ. සෑම රැස්වීමක් පැවැත්වීමටම සාධාරණ කාලයකට පෙර ඒ හා සම්බන්ධ ලිපි ලේඛන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් හට ලබා දීමට කටයුතු කරනු ලැබේ.

### විගණන කමිටුව

සමාගමේ විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු ඇතුලු අධ්‍යක්ෂවරු හතර දෙනෙකුගෙන් යුක්තය. විධායක නොවන අධ්‍යක්ෂවරයකු වන ආර්.ආර්.එම්. අමරතුංග මහතා විගණන කමිටුවේ සභාපතිත්වය උසුලන අතර වර්ෂය තුල ඇගයීම් 03 ක් සිදු කර ඇත. කාර්තු පදනම මත රැස්වීම් සැලසුම් කර ඇත. සමාගමේ සභාපති/ප්‍රධාන විධායක නිලධාරි, සමානාධිකාරි, අභ්‍යන්තර විගණක, ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි ආරාධිත අවස්ථා වලදි මෙම කමිටු රැස්වීම්වලට සහභාගී වේ.

### නීතිමය අවශ්‍යතාවලට අනුකූලවීම

සාංගමික සංස්ථාපත්‍රය, සාංගමික ව්‍යවස්ථාවලිය හා රාජ්‍ය ව්‍යාපාර සඳහා බලපවත්වන අනෙකුත් නීති රීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය හැකි සෑම උත්සාහයක්ම ගනු ලබයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සමාගමේ මූල්‍ය ප්‍රකාශන සැකසීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇත.

# අධ්‍යක්ෂ මණ්ඩල වගකීම පිළිබඳ ප්‍රකාශය

2007 අංක 07 දරන පනත යටතේ සමාගමේ මුල්‍ය වාර්තාකරනය පිළිබඳව හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තම වගකීම තහවුරු කරයි. සමාගමේ විගණකවරුන් වන අයියර් සහ සමාගම ඔවුන්ගේ වගකීම් පිළිබඳව සිය වර්තාවේ සංක්ෂිප්තව දක්වා ඇත. මෙම වාර්තාවේ ඇතුලත් කර ඇති 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වන ගිණුම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇති අතර 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන ප්‍රකාර තොරතුරු එමගින් දක්වා ඇත. සමාගම සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගෙන ඇති බවටත්, එම ක්‍රමවේදයන් සහ ගිණුම් ප්‍රමිතිකරණයන් මෙම මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදී නිරතුරුවම භාවිතා කළ බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය සහතික වේ. මෙම ප්‍රමිතීන්ට වෙනස් වන අවස්ථා ඇතොත්, ඒවා නිසියාකාරව පෙන්වා දී ඇති අතර ඊට හේතු දක්වා ඇත. යථාර්ථවාදී අන්දමින් හා සාධාරණ ලෙස සියලුම විනිශ්චයන් සහ ඇස්තමේන්තු කටයුතු කර ඇති බවත් සනාථ කෙරේ. මෙම මුල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී ගත් තීරණ හා ඇස්තමේන්තු නිවැරදි හා සත්‍ය ඒවා බවටද වන වගකීම අධ්‍යක්ෂවරු පිළිගනී. සමාගම තම මුල්‍ය තත්වය හා නිරවද්‍යතාව පෙන්නුම් කරවන ගිණුම් වාර්තා නිසි ලෙස පවත්වාගෙන යාමටද අධ්‍යක්ෂවරු සහතික වේ. වාර්ෂික වාර්තාවේ දක්වා ඇති මුල්‍ය ප්‍රකාශන මගින් සමාගමේ එදිනෙදා කර්යයන් සත්‍ය හා සාධාරණ මතයක් අන්තර්ගත වන බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රකාශ කර සිටී. සමාගමේ අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳව සම්පූර්ණ වගකීම අධ්‍යක්ෂවරු වෙත පැවරේ. ද්‍රව්‍යාත්මක අවප්‍රකාශ හා වංචා සම්පූර්ණයෙන් වළක්වාලන අභ්‍යන්තර ක්‍රමවේද පවතින බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරමින් ඔවුන් විසින් ක්‍රියාත්මක අභ්‍යන්තර පිරික්සුම්, අභ්‍යන්තර විගණන, මුල්‍ය හා වෙනත් පාලන ක්‍රමවේදයන් මගින් වියහැකි ද්‍රව්‍යාත්මක අවප්‍රකාශ හා වංචා වළක්වා හෝ සාධාරණ කාලයක් තුළ දැන ගැනීමට හැකි වන පරිදි සියලුම වත්කම් ආරක්ෂා කරලීමටත් ගනුදෙනු නිසිලෙස සිදුකර දැක්වීමට හැකිවන පරිදි සකසා ඇති බව සනාථ කරයි. ඉදිරි වසර ගණනාවක් පුරා අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් ප්‍රමාණාත්මකව ඇති බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වන අතර මුල්‍ය ප්‍රකාශන සැකසීමේදි අඛණ්ඩ පදනම නොවෙනස්ව අනුගමනය කරනු ඇත. සමාගමේ විගණකවරුන් වන වරලත් ගණකාධිකරුවන් වන අය්යර් සහ සමාගමට ඔවුන්ගේ වගකීම් ඉෂ්ට කිරීමට අවශ්‍ය සියලුම තොරතුරු සහ සහය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇත. විගණකරුවන් විසින් සියලුම මුල්‍ය ප්‍රකාශන, මුල්‍ය වාර්තා හා අදාළ දත්ත පරීක්ෂාකර ඔවුන්ගේ නිදහස් අදහස් පල කර ඇති අතර, එම වාර්තාවද මෙහි අඩංගු කර ඇත. සමාගම විසින් මුල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන දිනට ගෙවීමට නියමිත දන්නා සියලුම බදු හා සමාගමේ සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු ගෙවීම් සහ සමාගම විසින් ගෙවිය යුතු අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා අවසන් කර ඇති හෝ ගෙවීම් සිදු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇති බවට හෝ අධ්‍යක්ෂවරුන් සහතික වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

සීමාසහිත කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස්(පුද්) සමාගම

ලේකම්වරු . හලාවත වැවිලි සමාගම

# විගණන හා කළමනාකරණ කමිටු වාර්ථා

**විගණන හා කළමනාකරණ කමිටු වාර්ථා**

සීමාසහිත හලාවත වැවිලි සමාගමේ විගණන හා කළමනාකරණ කමිටුව 2013 ජූනි මස 2 වැනි දින දරන යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශකය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2010 දෙසැම්බර් මස 14 වැනි දින දරන අංක PED/ 55 චක්‍රලේඛය අනුව පිහිටුවන ලදී.
2014 වසර තුළ පහත දැක්වෙන දිනවල දී විගණන කමිටු රැස්වීම් පවත්වන ලදී:

- 2014 මාර්තු 31
- 2014 ජූනි 16
- 2014 සැප්තැම්බර් 05
- 2014 ඔක්තෝබර් 21
- 2014 දෙසැම්බර් 18

විගණන කමිටුවේ සාමාජිකයින් පහත පරිදි වෙති.

| නිලධාරියාගේ නම | තනතුර |
|---|---|
| 1. ආර්. එම්. අමරතුංග මහතා | සභාපති- විගණන කමිටුව - හලාවත වැවිලි සමාගම |
| 2. ප්‍රියංගනී ලියනගේ මහත්මිය | සාමාජික - විගණන කමිටුව - හලාවත වැවිලි සමාගම (භාණ්ඩාගාර නියෝජිත) |
| 3. අයි. එම්. ආර්. විදානගමගේ මහතා | සාමාජික - විගණන කමිටුව - හලාවත වැවිලි සමාගම |
| 4. කේ. බී. රත්නායක මහතා | සාමාජික - විගණන කමිටුව - හලාවත වැවිලි සමාගම |

2014 වර්ෂයේදි විගණන හා විමර්ෂන වාර්ථා 72 ක් විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.

| විගණන කමිටු රැස්වීම් දින | සාකච්ඡාව සඳහා ගන්නා ලද විගණන හා පරීක්ෂණ වාර්ථා ගණන |
|---|---|
| 2014 මාර්තු 31 | 11 |
| 2014 ජූනි 16 | 14 |
| 2014 සැප්තැම්බර් 05 | 15 |
| 2014 ඔක්තෝබර් 21 | 16 |
| 2014 දෙසැම්බර් 18 | 16 |

# විගණකවරුන්ගේ වාර්තාව

**ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව**

**සීමාසහිත හලාවත වැවිලි සමාගමේ කොටස්කරුවන් වෙත,**
මේ සමග ඇති සීමාසහිත හලාවත වැවිලි සමාගමේ මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලද අතර, 2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව විස්තරය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශයක් සහ විස්තරාත්මක සටහන් වලින්ද මූල්‍ය ප්‍රකාශය සමන්විත වේ.

**මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ වගකීම**
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කොට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සමාගමේ කළමනාකාරිත්වය වගකීම දරනු ලැබේ. එසේම ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් වලින් නිදහස්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා ඉදිරිපත් කිරීමට අදාල අභ්‍යන්තර පාලනයන් නිර්මාණය කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම, නිසි ගිණුම්කරණ ප්‍රමිතීන් තෝරාගෙන ඒවා ක්‍රියාවට නැංවීමත් වාතාවරණයට සුදුසු වගකිව යුතු ගිණුම් තක්සේරු සිදු කිරීම කෙරෙහිද කළමනාකාරිත්වය වගකීම දරයි.

**විගණනකරුවන්ගේ වගකීම**
අපගේ වගකීම වනුයේ අපගේ විගණන කටයුතු පාදක කරගෙන මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මතයක් ප්‍රකාශ කිරීමයි. අපගේ විගණන කාර්යන් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව පවත්වන ලදී. මෙම ප්‍රමිතීන්වල අවශ්‍යතාවය වනුයේ විගණනය නිසි පරිදි සැලසුම් හා ක්‍රියාත්මක කර මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක වැරදි දැක්වීම්වලින් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා ගැනීමය.
මූල්‍ය ප්‍රකාශනයේ දත්ත සහ අනාවරණය කිරීම් සාධක සමග නියැදි පදනම මත පරීක්ෂා කර බැලීම අපගේ විගණන ක්‍රියාවලියට ඇතුලත් වේ. සමස්ත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා කළමනාකාරිත්වය සකස් කරන ලද වැදගත් ඇස්තමේන්තු සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති තක්සේරු කිරීම සහ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ඇගයීම විගණනයට ඇතුලත් වේ. අපගේ විගණනය සඳහා අපගේ ප්‍රශස්ථ දැනුම සහ විශ්වාසය පරිදි අවශ්‍ය වූ තොරතුරු සහ විස්තාවරණයන් අප ලබා ගෙන තිබේ. එම නිසා අපගේ නිගමනයන්ට අනුව විගණනය කිරීම් තුළින් සාධාරණ මතයක් ප්‍රකාශ වන බව අපගේ විශ්වාසයයි.

**නිගමනය**
අපගේ නිරීක්ෂණ වලින් අනාවරණය වන පරිදි 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මෙම සමාගම නිසි ගිණුම් වාර්තා පවත්වාගෙන ඇති බව අපගේ මතයයි. 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී සමාගමේ ක්‍රියාකාරී කටයුතු පිළිබඳව සත්‍ය හා සාධාරණ දර්ශනයක් මූල්‍ය ප්‍රකාශයන් තුළින් පෙන්නුම් කරන අතර එකී කටයුතු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සිදුකර ඇත.

**අනෙකුත් නීත්‍යානුකූල සහ පාලන අවශ්‍යතා ගැන වාර්තාව**
මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151(2) වගන්තියට අනුකූල බව ප්‍රකාශ කරමු.

වරලත් ගණකාධිකාරිවරු
කොළඹ
2015 ජූලි 30 වන දින

* මෙම විගණන වාර්ථාව විගණකවරුන් විසින් ඉංග්‍රීසී බසින් 2015 ජූලි 30 වන දින නිකුත් කරන ලද විගණන වාර්ථාවේ සිංහල පරිවර්තනයක් වේ. විගණකවරුන් විසින් ඉදිරිපත් කල මුල් පිටපත ඉංග්‍රීසී වාර්ථාවේ 27 වන පිටුවේහි දක්වා ඇත.

# විස්තීර්ණ මූල්‍ය ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා | සටහන් | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|---|
| අයභාරය | 20 | 374,850,643 | 287,152,154 |
| විකුණුම් පිරිවැය | | (222,124,184) | (174,262,628) |
| **දළ ලාභය** | | **152,726,458** | **112,889,525** |
| වෙනත් මෙහෙයුම් ආදායම් සහ ලැබීම් | 21 | 37,371,708 | 76,206,174 |
| පරිපාලන වියදම් | | (104,412,082) | (92,660,057) |
| වෙනත් මෙහෙයුම් වියදම් | | (9,199,104) | (8,613,780) |
| මෙහෙයුම් තුලින් ජනනය වු ලාභය | | 76,486,980 | 87,821,863 |
| මූල්‍ය ආදායම | | 11,304,731 | 21,167,854 |
| මූල්‍ය පිරිවැය | 22 | (29,306,794) | (27,169,196) |
| මූල්‍ය වත්කම් මත හානි කරන අලාභය | | (119,757,808) | |
| බදු පෙර ලාභය | 23 | **(61,272,891)** | **81,820,521** |
| බදු වියදම් (වෙන්කිරීම්) | 24 | (799,013) | (8,072,974) |
| වර්ෂයේ ලාභය | | **(62,071,904)** | **73,747,547** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | 391,711 | (828,622) |
| වර්ෂයට මුළු විස්තීර්ණ ආදායම් බදු පසු | | **(61,680,193)** | **72,918,925** |
| කොටසක ඉපැයුම | 25 | **(3.10)** | **3.69** |

වරහන් තුල ඇත්තේ අඩුකිරීම්ය

පිටු අංක 32 සිට 53 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශණවලම කොටසක් වේ.

**2015 ජූලි මස 30 දින**

# මූල්‍ය තත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | 2014<br>රු. | 2013<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ජනවසම වතුවල හිස් භූමි වල කල්බදු හිමිකම් | 04 | 81,866,149 | 84,554,871 |
| ජනවසම කල්බදු දේපල පිරියත හා උපකරණ හිමිකම් (භාවිතයට ගැනීමට අයිතියක් ඇති ඉඩම් කල් බදු ජෛව හිමිකම් හැර) | 05 | 3,534,906 | 4,584,954 |
| ජනවසම වතු යායන් වල ජෛව වත්කම් වල කල්බදු හිමිකම | 06 | 37,481,845 | 40,919,718 |
| ජෛව වත්කම් (කල්බදු ජෛව වත්කම් හැර) | 07 | 551,970,575 | 470,345,817 |
| සින්නක්කර දේපල පිරියත හා උපකරණ හිමිකම් | 08 | 117,978,069 | 137,091,895 |
| | | 792,831,545 | 737,497,255 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 09 | 73,431,573 | 71,397,657 |
| අලෙවියට තබා ඇති වත්කම් | 10 | - | - |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 11 | 43,244,837 | 28,790,674 |
| රාජ්‍ය ව්‍යවසායන් වලට සපයන ලද මූල්‍ය පහසුකම් | 12 | - | 119,757,808 |
| වෙනත් ජංගම වත්කම් | | 1,259,779 | 1,430,790 |
| කෙටි කාලීන ආයෝජන | 13 | 113,275,930 | 128,995,973 |
| මුදල් හා බැංකු ශේෂයන් | | 2,332,902 | 5,857,391 |
| | | 233,545,022 | 356,230,292 |
| **මුළු වත්කම්** | | **1,026,376,567** | **1,093,727,547** |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | |
| කොටස් ප්‍රාග්ධනය | 14 | 200,000,010 | 200,000,010 |
| රඳවා ගත් ඉපයීම් | | 543,861,623 | 625,541,816 |
| **මුළු ස්කන්ධය** | | 743,861,633 | 825,541,826 |
| **ජංගම නොවන වගකීම් සහ විලම්බිත ආදායම්** | | | |
| විලම්භිත බදු බැරකම | 15 | 41,266,324 | 42,524,772 |
| විලම්භිත ආදායම්,- ප්‍රදාන හා ආධාර | 16 | 7,619,584 | 8,048,742 |
| විශ්‍රාමික ප්‍රතිලාභ පාරිතෝෂිත බැඳීම් | 17 | 65,120,485 | 58,780,004 |
| කල්බදු ගිවිසුම යටතේ ඇති බැඳියාවන් -. ජනවසම | 18 | 111,407,987 | 113,380,484 |
| | | 225,414,380 | 222,734,003 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවීමට ඇති දෑ | 19 | 56,831,606 | 45,559,744 |
| ආදායම් බදු බැරකම් | | (1,703,549) | (2,004,657) |
| කල්බදු ගිවිසුම යටතේ ඇති බැඳියාවන් ජනවසම | 18 | 1,972,497 | 1,896,631 |
| | | 57,100,554 | 45,451,718 |
| **මුළු ස්කන්ධය සහ වගකීම්** | | **1,026,376,567** | **1,093,727,547** |

වරහන් තුල ඇත්තේ අඩුකිරීමිය

පිටු අංක 32 සිට 53 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශණවලම කොටසක් වේ

**සනාථ කිරීම**

2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශය පිලියෙල කර ඇති බව සහතික කරමි

...........................................

ආර්. එම්. ආර්. බී. රත්නායක

ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරි

මූල්‍ය වාර්තා සැකසීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අත්සන් තබනු ලැබේ.

රවීන්ද්‍ර හේරත් මහතා
සභාපති හලාවත

AIYAR & CO. COLOMBO Chartered Accountants

එම්. ආර්. වී. ආර්. මීපුර මහතා
අධ්‍යක්ෂ

**2015 ජුලි මස 30 දින**

# ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා

| | කොටස් ප්‍රග්ධනය | සමුච්චිත ලාභය | එකතුව |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **2014 ජනවාරි 01 දිනට ශේෂය** | 200,000,010 | 587,622,891 | 787,622,901 |
| වර්ෂයේ ශුද්ධ ලාභය | - | 73,747,547 | 73,747,547 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | **(828,622)** | **(828,622)** |
| මුළු විස්තීර්ණ ආදායම් | - | 72,918,925 | 72,918,925 |
| ලාභාංශ ගෙවීම් | - | (35,000,000) | (35,000,000) |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **200,000,010** | **625,541,816** | **825,541,826** |
| ලාභාංශ ගෙවීම් | | **(20,000,000)** | **(20,000,000)** |
| වර්ෂයේ ශුද්ධ ලාභය | | (62,071,904) | (62,071,904) |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | **391,711** | **391,711** |
| මුළු විස්තීර්ණ ආදායම් | 200,000,010 | 543,861,623 | 743,861,633 |
| **2014 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **200,000,010** | **543,861,623** | **743,861,633** |

වරහන් තුල ඇත්තේ අඩුකිරීම්ය

පිටු අංක 32 සිට 53 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශණවලම කොටසක් වේ

**2015 ජුලි මස 30 දින**

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂය සඳහා

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ / සඳහා (යෙදවූ) මුදල් ප්‍රවාහය** | | |
| බදු පෙර ලාභය | (61,272,891) | 81,820,521 |
| **ගැලපීම්** | | |
| . ක්ෂයවීම් / ක්‍රමක්ෂයවීම් | 39,412,876 | 35,298,925 |
| . සේවක ලාභ කොටස් සඳහා වෙන්කිරීම් | 5,711,685 | 5,386,761 |
| . ප්‍රදාන සඳහා වූ ක්‍රමක්ෂයවීම් | (429,158) | (429,158) |
| . රාජ්‍ය කල්බදු සඳහා ගාස්තු | 29,306,794 | 27,169,196 |
| . පෙර වර්ෂයේ ගැලපිම් (පාරිතොෂික ගැලපිම්) | - | 863,379 |
| . මූල්‍ය ආදායම් | (11,304,731) | (21,167,854) |
| . නිශ්ෂිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය සඳහා වෙන්කිරීම් | 11,876,634 | 11,756,041 |
| . දේපල පිරියත හා උපකරණ අපහරණය කිරීමෙන් ලත් ලාභය | - | (15,795,773) |
| . මූල්‍ය වත්කම් වල හානිකරන අලාභය | 119,757,808 | - |
| . ලියා හරින ලද දේපල පිරියත හා උපකරණ | 161,256 | - |
| | **133,220,273** | **124,902,038** |
| **වෙනස්වීම්** | | |
| . තොගවල (වැඩිවීම්) / අඩුවීම් | (2,033,916) | 11,207,984 |
| . කිරි පශු සම්පත් | 605,000 | (4,739,500) |
| . වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ වල (වැඩිවීම්) / අඩුවීම් | (15,175,213) | 6,774,194 |
| . වෙනත් ජංගම වත්කම් | 171,011 | 3,247,226 |
| . වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 10,909,672 | (2,871,833) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | **127,696,826** | **138,520,109** |
| . නිශ්ෂිත ප්‍රතිලාභ සැලසුම් ගෙවීම් | (5,144,442) | (5,621,469) |
| . සේවක ලාභ කොටස් සඳහා ගෙවීම් | (5,349,495) | (4,672,272) |
| . මූල්‍ය කල්බදු ගෙවීම් | (29,306,793) | (33,929,164) |
| . මූල්‍ය ආදායම් ලැබීම් | 12,025,778 | 28,859,786 |
| . ආදායම් බදු ගෙවීම් | (1,756,353) | (5,852,587) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **98,165,521** | **117,304,403** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | | |
| . දේපල පිරියත හා උපකරණ එකතු කිරීමෙන් | (6,717,623) | (63,775,030) |
| . ක්ෂේත්‍ර සංවර්ධන වියදම් | (88,795,799) | (102,320,954) |
| . දේපල පිරියත හා උපකරණ අලෙවියෙන් ලැබීම් | - | 16,535,450 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(95,513,422)** | **(149,560,534)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මූල්‍ය ප්‍රවාහය** | | |
| . ලාභාංශ ගෙවීම් | (20,000,000) | (35,000,000) |
| . රාජ්‍ය කල්බදු සඳහා ප්‍රාග්ධන පියවීම් | (1,896,631) | (1,823,684) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(21,896,631)** | **(36,823,684)** |
| **. මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම)** | (19,244,532) | (69,079,815) |
| **. වසර ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම (සටහන අ)** | 134,853,364 | 203,933,179 |
| **. වසරාවසානයේ මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම (සටහන ආ)** | **115,608,832** | **134,853,364** |
| **සටහන අ** | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ වසර ආරම්භයේ | | |
| . කෙටි කාලීන ආයෝජන | 128,995,973 | 199,377,169 |
| . මුදල් හා බැංකු ශේෂය | 5,857,391 | 4,556,010 |
| | 134,853,364 | 203,933,179 |
| **සටහන ආ** | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ වසර අවසානයේ | | |
| . කෙටි කාලීන ආයෝජන | 113,275,930 | 128,995,973 |
| . මුදල් හා බැංකු ශේෂය | 2,332,902 | 5,857,391 |
| | **115,608,832** | **134,853,364** |

වරහන් තුල ඇත්තේ අඩුකිරීමිය

පිටු අංක 32 සිට 53 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සටහන් මූල්‍ය ප්‍රකාශනවලම කොටසක් වේ

**2015 ජුලි මස 30 දින**

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2014 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

## 1 සංස්ථාපිත තොරතුරු

### 1.1 වාර්තාකරන ස්ථිතිය

#### 1.1.1 පිහිටුවීම හා නෛතික ආකෘතිය

සීමාසහිත හලාවත වැවිලි සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ (සමාගම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ යළි ලියාපදිංචි කරන ලදී) සහ 1987 අංක 23 දරන ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත අනුව ශ්‍රී ලංකාවේ සංස්ථාගත කළ වගකීමෙන් සීමාසහිත පොදු සමාගමක් වේ.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය හලාවත, පුත්තලම් පාර, අංක 165 යන ලිපිනයේ පිහිටා ඇති අතර කොළඹ කාර්යාලය කොළඹ 01, ඩියුක් වීදිය, අංක 11, සීඩීජී ගොඩනැගිල්ල, බිම් මහළ යන ලිපිනයේ පිහිටා ඇත. වතුයායවල් පුත්තලම, කුරුණෑගල සහ ගම්පහ යන වැවිලි දිස්ත්‍රික්කවල පිහිටා ඇත.

#### 1.1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

පොල් වගා කිරීම, කොප්පරා නිෂ්පාදනය හා අමු පොල් හා කොප්පරා අලෙවිය වසර තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් විය.

#### 1.1.3 මව් ආයතනය සහ අවසන් මව් ව්‍යාපාරය

සමාගමේ මව් ආයතනය වනුයේ ශ්‍රී ලංකා රජය යි.

### 1.2 නිකුත් කිරීම සඳහා බලය දීමේ දිනය

2015 ජූලි මස 30 වැනි දින දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අනුව 2014 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා හලාවත වැවිලි සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය ලබා දෙන ලදී.

## 2 සකස් කිරීමේ පදනම

### 2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශනය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන් පිළිබඳ 1995 අංක 15 දරණ පනත යටතේ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය (සී ඒ එස් එල් ) විසින් නිකුත් කරන ලද ගිණුම්කරණ ප්‍රමිත (SLFRS/LKAS ) සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ විධිවිධාන වලට අනුකූලව සකසා ඇත.

### 2.2 ඇගයීම් පදනම

මූල්‍ය ප්‍රකාශනවල අංක 05, 06 සහ 07 දරන සටහන්වල විස්තර කර ඇති පරිදි ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් එනම් කල්බදු ගිවිසුම යටතේ ඇති JEDB වතු හැරුණු කොට ඓතිහාසික පිරිවැය පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. යෝග්‍ය අවස්ථාවල දී විශේෂ ප්‍රතිපත්ති පසුව එළැඹෙන සටහන්වල විස්තර කර ඇති අතර මූල්‍ය ප්‍රකාශනවල ඇති උද්ධමනීය සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නැත.

### 2.3 භාවිතා කරන සහ ඉදිරිපත් කරන මුදල් ඒකකය

සමාගමේ භාවිතා කරන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් මඟින් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදරිරිපත් කර ඇත. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති සියලු මූල්‍ය තොරතුරු ආසන්න රුපියලේ අගයට දක්වා ඇත.

### 2.4 ඇස්තමේන්තු හා තීන්දු භාවිතා කිරීම

ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්වලට අනුකූලවන පරිදි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අදාළ කර ගනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කර ඇති වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් යනාදියට බලපාන්නා වූ තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පිතයන් තීරණය කිරීමට කළමනාකරණයට සිදු වේ. තීරණ හා ඇස්තමේන්තු වාතාවරණ යටතේ සාධාරණ වන බවට විශ්වාස කරන අපේක්ෂාවන් ඇතුළු ඓතිහාසික අත්දැකීම් හා අනෙක් සාධක මත පදනම් වේ. එබැවින් සත්‍ය අත්දැකීම් සහ ප්‍රතිඵල මෙම තීරණ හා ඇස්තමේන්තුවලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු හා පාදක වූ උපකල්පන කෙරීගෙන යන පදනම මත විශ්ලේෂණය කරනු ලැබේ. ඇස්තමේන්තු සංශෝධනය කර ඇති කාලපරිච්ඡේදයට පමණක් එම සංශෝධන බලපාන්නේ නම් එම කාලපරිච්ඡේදය තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධනය ද සිදු කරනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2014 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

**2.5 අඛණ්ඩ පැවැත්ම**

ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා සමාගමේ හැකියාව සමාගමේ කළමනාකරීත්වය විසින් ඇගයීමට ලක් කර ඇති අතර දැනගත හැකි අනාගත කාලයක් දක්වා ව්‍යාපාර කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට අවශ්‍ය සම්පත් සමාගමට තිබෙන බවට සෑහීමකට පත් විය. තව ද ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව කර ගෙන යාමේ සමාගමේ හැකියාව කෙරෙහි සැලකිය යුතු තරමේ සැකයක් ඇති කළ හැකි කිසියම් වැදගත් අවිනිශ්චිතතාවන් පිළිබඳව කළමනාකාරීත්වයට වාර්තා වී නොමැත. අඛණ්ඩ බව පිලිබඳ සංකල්පය පදනම්ව මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව සකස් කරනු ලැබේ.

**2.6 සංසන්දනාත්මක තොරතුරු**

ආයතනයේ ගිණුමකරණ ප්‍රතිපත්ති නොවෙනස් ව පවත්වා ගෙන යන අතර ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම්වලට ගැලපෙන පරිදි අවශ්‍ය අවස්ථාවලදී පෙර වර්ෂයේ සංඛ්‍යා නැවත පිළියෙල කර ඇත.

**2.7 වාර්තාකරන දිනයෙන් පසු හටගත් සිද්ධීන්**

වාර්තාකරන දිනයෙන් පසු හටගත් සියලුම ප්‍රමාණාත්මක සිද්ධීන් සැලකිල්ලට ගෙන ඇති අතර සුදුසු අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම හෝ අනාවරණය කිරීම සිදු කර ඇත.

**3 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය**

**3.1 වත්කම් හා ඒවායේ අගය කිරීම් සඳහා පදනම්**

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කළ වත්කම් යනු මුදල් හා සමාගමේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතු අතරතුර දී හෝ වාර්තා කරන දිනයේ සිට වසරක කාල පරිච්ඡේදයක් ඇතුලත යන දෙකෙන් අඩු කාලය තුළ මුදල් බවට පත් කරනු ලබන වත්කම් වේ. වර්තා කරන දිනයේ සිට වසරක කාලයකට වඩා වැඩි කාල පරිච්ඡේදයක් සඳහා සමාගමට රඳවා ගැනීමට සිදුවන වත්කම් ජංගම නොවන වත්කම් වේ.

**3.1.1 දේපල, පිරියත හා උපකරණ**

**3.1.1.1 හඳුනා ගැනීම සහ ඇගයීම**

දේපළ, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැය මත (හෝ කල්බදු හිස් ඉඩම් නම් ඒවායේ තක්සේරු වටිනාකමට) සමුච්චිත ක්ෂය වෙන් කිරීම් හා අපහරණයන් සිදුවී ඇත්නම් එහි අලාභය අඩු කිරීමෙන් පසු දක්වයි.

(a) සන්තක දේපල

දේපළ, පිරියත හා උපකරණ එය සන්තක කරගැනීමේ දී දැරූ සෘජු පිරිවැයයි. සමාගම විසින් ඉදිකරන ලද වත්කමක් නම් එම වත්කම අදාළ කාර්යයට සුදුසු තත්ත්වයට ගෙන ඒම දක්වා දැරූ සියලු පිරිවැය, එනම් ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය හා අනෙකුත් සියලු පිරිවැය ඇතුළත් වේ. උපකරණ ක්‍රියාකාරිත්වයට අදාළව මිලදී ගත් මෘදුකාංග අදාළ උපකරණයේ අඛණ්ඩ ක්‍රියාවලියේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කර ඇත.

දේපළ, පිරියත හා උපකරණවල යම් කිසි සුවිශේෂ කොටස් යම් කාල සීමාවලදී මාරු කිරීම් සිදුකරන අවස්ථාවලදී පිළිවෙලින් එම කොටස් ඵලදායි ආයු කාලයක් හා ක්ෂය කල හැකි තනි ඒකක වශයෙන් සලකා කටයුතු කරයි. එසේම ප්‍රධාන පරීක්ෂණයක් පවත්වනු ලබන අවස්ථාවලදී සියලු නිර්නායකයන් සපුරා ඇත්නම් එහි පිරිවැය හදුනාගනු ලබන්නේ පිරියත හා උපකරණ පවත්වාගෙන යන ප්‍රමාණයට ප්‍රතිස්ථාපනයක් සේ සළකනු ලැබීමෙන්ය. අනිකුත් සියලුම අලුත්වැඩියා හා නඩත්තු විස්තීර්ණ ප්‍රකාශනයේ වියදම් ලෙස දැක්වේ. නොනිමි ප්‍රාග්ධන, ඊට අදාළ වත්කම්වලට මාරු කරනු ලබන්නේ එහි ප්‍රථම භාවිතයේදී හෝ වත්කම් ක්‍රියාත්මක කරන අවස්ථාවේදීමය. ප්‍රාග්ධන නොනිමි වැඩ පළමු උපයෝජනයේ දී හෝ වත්කම ආරම්භ කරන වේලාවේ දී එක් එක් වත්කම් ගිණුම්වලට මාරු කරනු ලැබේ.

(b) කල්බදු වත්කම්

මූල්‍ය කල්බදු යටතේ ලබාගත් දේපල, පිරියත හා උපකරණ (බදු ගත් භාණ්ඩය හිමිකර ගැනීමෙන් සමාගමට අවදානමක් හෝ වාසියක් සෘජුවම ලැබෙන්නේ නම්) ඒවායේ සාධාරණ වටිනාකම හා අවම වර්ථමාන කල්බදු වටිනාකමින් අඩු අගය මත ප්‍රග්ධනිතකරණය කර සමාගම විසින් එම වත්කම් භාවිතා කිරීමට අපේක්ෂා කරන කාලපරිච්ඡේදය පුරා ක්‍රමක්ෂය කර දක්වයි. බදුකරුට ගෙවීමට ඇති ප්‍රාග්ධන වටිනාකමට සමාන ප්‍රමාණය වගකීම් ලෙස පෙන්වා ඇත. එක් එක් මූල්‍ය වර්ෂයේදී ගෙවන බදු වාරිකය තුළ අන්තර්ගත පොලී ප්‍රමාණය එම වර්ෂයේ වියදමක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට හර කරනු ඇත. මෙයින් එකම අනුපාතයක් යටතේ සෑම වර්ෂයක් අවසානයේම පවතින බදු වගකීම් ශේෂයට පොලී ගණනය වීම සිදුවේ. බදු දේපල වැඩි දියුණු කිරීම සඳහා දරනු ලබන වියදම් ප්‍රාග්ධනීකරණය කර ඉතිරි බදු කාලය හෝ ඇස්තමේන්තු කරන ලද ඵලදායී ජීවිත කාලය හෝ යන දෙකෙන් අඩු කාල පරිච්ඡේදය තුළ ක්ෂය කරනු ලබයි.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2014 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

### 3.1.1.2 පසුකාලීන පිරිවැය

දේපල, පිරියත හෝ උපකරණයක කොටස් ප්‍රතිස්ථාපනය කිරීමේදි දරණ පිරිවැය එම කොටස පවත්වාගෙන යන ප්‍රමාණය, එම කොටසෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා එනු ඇති බව සහ එය නිශ්චිතව මැනීමට හැකි නම් එය වත්කමක් ලෙස හඳුනා ගනු ඇත. පවත්වාගෙන යන ප්‍රතිස්ථාපන කොටස් පහත දක්වා ඇති ප්‍රතිපත්තියට අනුව නොහැඳිනීම් ලෙස හඳුන්වයි. දේපල, පිරියත සහ උපකරණ වලට දෛනිකව කරන නඩත්තු වර්ෂයේ ලාභ හෝ පාඩු ලෙස හඳුනා ගැනේ.

### 3.1.1.3 හඳුනා නොගැනීම

දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීමේදී හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ නැතැයි හැඟෙන අවස්ථාවලදී එය වත්කමක් ලෙස හඳුනා නොගනි. ඒ තුළින් ලැබෙන ලැබීම් හා පාඩු, ලාභ හෝ පාඩු වශයෙන් සළකන අතර ප්‍රතිලාභ අයභාරය ලෙස වර්ගීකරණය නොකරයි.

### 3.1.1.4 ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය

#### (a) ක්ෂයවීම්

දේපල, පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමය මත පදනම්ව ඒ එක් එක් දේපල, පිරියත හා උපකරණවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්ෂය ගණනය කරනු ලැබේ. වර්තමානයේ ඇස්තමේන්තුගත ඵලදායි ජීවිත කාලය සන්සන්දනාත්මකව පහත පරිදි වේ.

| | වසර ගණන | අනුපාතිකය % |
|---|---|---|
| ගොඩනැගිලි | 40 | 2.50 |
| පිරියත හා යන්ත්‍ර සූත්‍ර | 15 | 6.67 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 10 | 10.00 |
| මෝටර් රථ | 05 | 20.00 |
| උපකරණ | 08 | 12.50 |
| ස්ථිර ඉඩම් සංවර්ධනය | 30 | 3.33 |
| වැටවල් | 03 | 33.33 |
| ජල සැපයුම | 20 | 5.00 |

වත්කම් ක්ෂයවීම එය භාවිතය සඳහා ගත් අවස්ථාවේ ආරම්භ වී එය අලෙවිය සඳහා තබා ඇති බවට හෝ වතකමක් ලෙස හඳුනා නොගන්නා බවට වර්ගීකරණය කර ඇති දිනයේ දී අවසන් වේ. ක්ෂය ක්‍රමය ඵලදායී ජීවිත කාලය හා ශේෂ වටිනාකම් වර්තාකරන දිනයේ දී අවශ්‍ය වන්නේ නම් නැවත තක්සේරු කරනු ලබයි.

#### (b)ක්‍රමක්ෂය

කල්බදු කාලය අවසන් වීමත් සමගම නිශ්චිතවම වත්කමේ හිමිකරු වන බව දන්වා විට හැරෙන්නට කල්බදු යටතේ ඇති වත්කම් කල්බදු කාලය හෝ ඵලදායී ආයු කාලය යන දෙකෙන් කෙටි කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබයි. ජන වසමෙන් බදු ගත් වත්කම්වල බදු කාලය 2045 න් අවසන් වනු ඇත.

ජනවසම මගින් අත්කර ගත් වත්කම්වල බදු අයිතිය ඉතිරි බදු කාලය සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය යන දෙකෙන් අඩු කාලය තුළ සමාන කොටස්වලින් ක්‍රමක්ෂය කරනු ලබන අතර වර්තමාන ඇස්තමේන්තු කළ ඵලදායී ජීවිත කාලය සන්සන්දනාත්මකව පහත දැක්වෙන පරිදි වේ.

| | වසර ගණන | අනුපාතිකය % |
|---|---|---|
| හිස්ඉඩම් සඳහා කල් බදු අයිතිය | 53 | 1.89 |
| ඉඩමේ වැඩි දියුණු කිරීම් | 30 | 3.33 |
| වෙනත් හිමි වූ වත්කම් | 30 | 3.33 |
| ගොඩනැගිලි | 25 | 4.00 |
| යන්ත්‍රසූත්‍ර | 15 | 6.67 |
| ජල සැපයුම | 20 | 5.00 |

### 3.1.2 ජෛව වත්කම්

### 3.1.2.1 නොමිරූ හා මේරූ වගාවන්

#### (a) නිශ්චල කල්බදු හිමිකම ඇති ජෛව වත්කම් (නොමිරූ හා මේරූ වගා )

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2014 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

වැවිලි වතු පෞද්ගලිකරණය කරන අවස්ථාවේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ UITF රීති නියමයන්ට අනුව ජනවසම වතයායවල මූල්‍ය කල්බදු යටතේ නිශ්චල කල්බදු හිමිකම ඇති ජෛව වත්කම් (නොමේරූ හා මේරූ වගාවන්) 1992 ජුනි 22 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි සමාගමේ ගිණුම්වලට ගෙන ඇත.

කල්බදු හිමිකම ඇති ජෛව වත්කම් සරල මාර්ග පදනම යටතේ විස්තීරණ මූල්‍ය ප්‍රකාශනය තුල වර්තමාන සහ ඇස්තමේන්තු කළ ඵලදායී ජීවිත කාලය පුරා සංසන්දනාත්මකව පහත සඳහන් ආකාරයට ක්‍රමක්ෂය කර ඇත.

| | වසර ගණන | අනුපාතිකය % |
|---|---|---|
| මේරූ වගාව | 30 | 3.33 |

**කල්බදු දේපල සංවර්ධනය කිරීම (නොමේරූ සහ මේරූ වගා)**

වගා කරන කාලය තුළ එනම්, භූමිය සකස් කිරීම, පුනරුත්ථාපනය, අලුත් වගා කිරීම. නැවත වගා කිරීම,අන්තර් වගා කිරීම්, සහ නව වගා සඳහා පොහොර යෙදීම ආදියේ සිට අස්වැන්න නෙලීම දක්වා (වගාව මේරූ තත්වයට පත් වන තුරු) වූ පිරිවැය නොමේරූ වගා යටතට ගැනේ. ඵල දැරීම ආරම්භ වන වර්ෂයේදී මේරූ වගා යටතට මාරු කරනු ඇත. මෙම නොමේරූ වගා ඍජු පිරිවැය සහ අන්තර්ග්‍රහනය කරන ලද පොදු කාර්යය පිරිවැය වලින් සමන්විත වේ.
කල්බදු ඉඩම් සංවර්ධනය ක්ෂයවීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සරල මාර්ග පදනමට අනුකූලව බදු කාලය අවසන් වීමට ඇති කාලය හෝ සංවර්ධනයේ ඵලදායි ආයු කාල සීමාව හෝ, දෙකෙන් අඩු එක ලෙස හඳුනා ගනු ඇත.
ඇස්තමේන්තු ගත වර්තමාන සහ සංසන්දනාත්මක ඵලදායි ආයු කාලය පහත දක්වා ඇත.

| | වසර ගණන | අනුපාතිකය % |
|---|---|---|
| පොල් | 50 | 2.00 |
| කජු | 25 | 4.00 |
| වෙනත් | 20 | 5.00 |

**3.1.2.2 ගව පශු සම්පත**

ගව පශු සම්පත් මනිනු ලබන්නේ ඒවායේ සාධාරණ අගයයෙන් විකුණුම් පිරිවැය අඩු කිරීමෙනි. ජාතික පශු සම්පත් මණ්ඩලය විසින් නිකුත් කරන ලද චක්‍ර ලේඛයට අනුව පශු සම්පත් සාධාරණ අගය තීරණය කරනු ලැබේ.
.

**3.1. 3 විකිණීමට ඇති ජංගම නොවන වත්කම්**

අඛණ්ඩ භාවිතයට වඩා මූලිකව විකිණීම තුළින් අයකර ගැනීමට බලාපොරොත්තු වන ජංගම නොවන වත්කම් විකිණීම සඳහා වෙන්කර ඇති දෑ ලෙස වර්ගීකරණය කෙරේ. විකිණීමට තබා ඇති වත්කම් එසේ කිරීමට ආසන්නතම අවස්ථාවේ ඒවායේ ධාරණ අගය හෝ සාධාරණ වටිනාකමින් විකුණුම් වියදම් අඩු කර ලැබෙන අගය යන දෙකෙන් අඩු අගය සේ සැලකේ. පවතින තත්ත්වයෙන්ම විකිණීමේ ඉහළ සම්භාව්‍යතාවයක් ඇති ජංගම නොවන වත්කම් විකිණීමට ඇති දෑ ලෙස වර්ගීකරණය කරනු ඇත.
"විකිණීමට වෙන්කර ඇතිදෑ" ලෙස වර්ගීකරණය කළ දේපල, පිරියත හෝ උපකරණ ක්ෂය කිරීමට හෝ ක්‍රමක්ෂය කිරීමකට භාජනය නොවේ.

**3.1.4 තොගය**

තොග පිරිවැය හා ඇස්තමේන්තු ගත ශුද්ධ උපලබ්ධි වටිනාකම මත යල්පැනුම් හා මන්දගාමීව අලෙවි වන ද්‍රව්‍ය සඳහා අවශ්‍ය වෙන් කිරීම් සිදු කිරීමෙන් පසුව අගයන්ගෙන් අඩු අගය මත ගණනය කර දක්වා ඇත. ශුද්ධ උපලබ්ධි අගය යනු උපලබ්ධි පිරිවැය ප්‍රතිපාදන සලසා හා/හෝ දැනට පවත්නා තත්වයෙන් විකිණිය හැකි තත්වයට පරිවර්තන පිරිවැයට සිදු කර සමාන්‍ය ව්‍යාපාරික ක්‍රමවේදය අනුව තොග විකිණිය හැකි මිල ගණන්ය.

තොගය වර්තමාන ස්ථානයට සහ තත්ත්වයට රැගෙන ඒම සඳහා දැරූ පිරිවැය පහත දැක්වෙන සූත්‍රය භාවිතා කර ගණනය කරනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2014 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

| | |
|---|---|
| **පරිභෝජන සහ අමතර ද්‍රව්‍ය යෙදවුම්** | පෙර පිවිසි පෙර නිකුත් පදනම මත සැබෑ පිරිවැය |
| **පැළ තවාන් සහ බෝග වැවීම** | සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය පිරිවැය හා සෘජුව ආරෝපණය කළ හැකි පොදු කාර්යය පිළිබඳ යෝග්‍ය සමානුපාතික පිරිවැය |
| **නෙලා ගත් අස්වැන්න** | ජෛව වත්කම්වලින් නෙලා ගත් කෘෂි නිෂ්පාදන ඒවායේ සාධාරණ වටිනාකමින් විකුණුම් වියදම් අඩු කර නෙලා ගත් අවස්ථාවේ දීම අගය කරයි.<br><br>අර්ධ නිමි සහ නිමි කෘෂිකාර්මික තොග අගය කිරීමේ දී කෘෂි නිෂ්පාදනවල සාධාරණ වටිනාකමට පරිවර්තනය කිරීමේ පිරිවැය එකතු කර අගය කරයි. |
| **පශු සම්පත** | කිරි පශු සම්පත් තොග මනිනු ලබන්නේ සාධාරණ වටිනාකමින් විකුණුම් වියදම් අඩු කිරීමෙනි.<br>කිරි පශු සම්පතේ සාධාරණ වටිනාකම ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය නිකුත් කරනු ලබන චක්‍රලේඛ අනුව තීරණය කරනු ලැබේ. |

### 3.1.5 මූල්‍ය වත්කම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 (LKAS39) යටතට ගැනෙන මූල්‍ය වත්කම් ලෙස, ලාභ හෝ අලාභ මත වෙළඳපල වටිනාකම් ඇති මූල්‍ය වත්කම්, ණය හෝ ලැබිය යුතු දෑ හෝ, කල්පිරෙන තෙක් තබා ගෙන ඇති ආයෝජන හෝ විකිණීම් සඳහා ඇති මූල්‍ය වත්කම් ලෙස දැක්විය හැක. සමාගම එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය මුල් හඳුනාගැනීමේ දී තීරණය කරනු ලැබේ. සියලුම මූල්‍ය වත්කම් මූලිකවම සාධාරණ වටිනාකම එකතුව මත ද ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකම අනුව නොමැති වත්කම් සම්බන්ධව වන විට සෘජුවම ආරෝපණය වන ගණුදෙනු පිරිවැය හරහා හඳුනා ගනු ලැබේ.

මුදල්, කෙටි කාලීන තැන්පතු, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ, රාජ්‍ය ආයතනවලට ලබා දුන් ණය සමාගමේ මූල්‍ය වත්කම්වලට ඇතුලත් වේ.

### 3.1.5.1 ලාභ හෝ පාඩුමත සාධාරණ අගය ඇති මූල්‍ය වත්කම්

වෙළඳාම සඳහා ඇති මූල්‍ය වත්කම් හා ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට මූලිකව හඳුනාගත් මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම සහිත මූල්‍ය වත්කම්වලට ඇතුලත් වේ. මූල්‍ය වත්කම් අලෙවි කාර්යය සඳහා අත්කර ගත්තේ නම් හෝ ආසන්න කාලයකින් නැවත මිලදී ගත්තේ නම් ඒවා වෙළඳාම සඳහා රඳවා ගත් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම සහිත මූල්‍ය වත්කම් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායම හෝ මූල්‍ය වියදම යටතේ සාධාරණ වටිනාකමට කළ වෙනස්කම් ඇතිව සාධාරණ වටිනාකම අනුව මූල්‍ය තත්ව ප්‍රකාශනයේ දැක්වේ.

සමාගම ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකම අනුව මූලික අදියරේ දී කිසිදු මූලික වත්කමක් නම් කර නැත.

### 3.1.5.2 ණය හා ලැබිය යුතු දෑ

ණය හා ලැබිය යුතු දෑ යනු ස්ථාවර හෝ නිශ්චිත වාරික ගෙවීම් සහිත ක්‍රියාකාරී වෙළඳපල තුළ මිල තීරණය නොවූ, ව්‍යුත්පන්න නොවූ මූල්‍ය වත්කම් වේ.

මූලිකවම සාධාරණ වටිනාකම හා අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීම මත සෘජුව හඳුනා ගන්නා ගනුදෙනු පිරිවැය සමග හඳුනා ගනී. පසුව සඵල පෙළී අනුපාත ක්‍රමය මත අපහායනයන් අඩු කර ක්‍රමක්ෂය කර පවත්වා ගනී.

ක්‍රමක්ෂය කිරීමේ පිරිවැය ගණනය කරනු ලබන්නේ වට්ටම් අත්පත් කර ගන්නා අවස්ථාවේ වූ අධි මිල ගාස්තු හෝ යම් වියදමක් වූයේ නම් ඒවා සඵල පොලී අනුපාත ක්‍රමයේ සංගටනීය කොටස ලෙස සැලකිල්ලට ගැනීමෙනි.

සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂය විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ඇති මූල්‍ය ආදායම්වල ඇතුලත් වේ. හානිකරණය වීමෙන් මතුවන අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ ඇති මූල්‍ය පිරිවැයවල හඳුනා ගෙන ඇත.

වෙළඳ ලැබිය යුතු දෑ, සම්බන්ධිත පාර්ශව වලින් ලැබිය යුතු මුදල්, තැන්පතු, අත්තිකාරම් හා වෙනත් ලැබිය යුතු දෑ ණය හා ලැබිය යුතු දෑ වලට ඇතුලත් වේ.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2014 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

**වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ**

වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ පහත සඳහන් අවස්ථාවන් හැර, ප්‍රථමයෙන් එහි සාධාරණ අගය මත හඳුනා ගනී. පසුව ක්‍රමක්ෂය වටිනාකමෙන් හානිකරණයක් සිදුවී ඇත්නම් ඒ සඳහා වෙන් කිරීම් සිදු කර පවත්වා ගනී.

සම්බන්ධිත පාර්ශවයන්ට, නැවත ගෙවීමේ දී නිශ්චිත කොන්දේසි රහිතව ලබා දෙන ලද ණය පිරිවැයෙන්, හානිකරණයන් සිදුවී ඇත්නම් ඒ සඳහා අඩමාන හා බොල් ණය ප්‍රතිපාදනය සිදු කර මනිනු ලබයි.

ප්‍රකාශිත පොලී පදනමක් රහිත සහ වට්ටම බලපෑමකින් තොරව කෙටි කාලීන ලැබිය යුතු දෑ ඉන්වොයිස් වටිනාකම මත හානිකරණය සඳහා වෙන් කිරීම් සිදු කළ යුතු වීම බොල් හා අඩමාන ණය සඳහා වූ ප්‍රතිපාදනයන්ට යටත්ව මනිනු ලබයි.

**මුදල් හා මුදල් සමාන දෑ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මුදල් හා මුදල් සමාන දෑ යන්නට අතැති මුදල් , බැංකුවේ ඇති මුදල්, ස්ථාවර තැන්පතු හා ඉතුරුම් තැන්පතු ද ඇතුලත් වේ.

**3.1.5.3 කල්පිරීමට තිබෙන ආයෝජන**

සමාගමට ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත හා ස්ථාවර, කල්පිරීම් සහිත ව්‍යුත්පන්න නොවූ මූල්‍ය වත්කම් කල්පිරීම් වන තෙක් තබා ගැනීමට අදහසක් හා හැකියාවක් තිබෙන්නේ නම් ඒවා කල්පිරීමට තබා ගත් මූල්‍ය වත්කම් ලෙස වර්ග කරනු ලැබේ. මූලික ඇගයීමෙන් පසු කල්පිරීමට තබා ගත් ආයෝජන සඵල පොළී ක්‍රමය යොදා ගෙන ක්‍රමක්ෂ පිරිවැයෙන් හානිකරණයන් වී ඇත්නම් අඩු කර ඇගයීම් කරනු ලැබේ. සඵල පොළී අනුපාතික ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය ආදායමේ දක්වා ඇත. හානිකරණය තුළින් ඇතිවන අලාභ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ මූල්‍ය පිරිවැය යටතේ හඳුනා ගෙන ඇත. 2014 වසර තුළ සමාගමේ කල්පිරීමට තබා ගත් ආයෝජන නොමැත (2013 - ශූන්‍ය).

**3.1.5.4 අලෙවියට ඇති මූල්‍ය ආයෝජන**

අලෙවියට ඇති මූල්‍ය වත්කම් යනු අලෙවියට ඇති ලෙස නම් කර ඇති හා ඉහත වර්ගීකරණය කළ මූල්‍ය වත්කම් නොවන ව්‍යුත්පන්න නොවූ මූල්‍ය වත්කම් වේ. මූලික හඳුනා ගැනීමෙන් පසුව ඒවායේ වෙනස්වීම් හා සාධාරණ වටිනාකම මත අගයනු ලබයි. ඒ හැර හානිකරණය වීම වෙනත් විස්තීරණ ආදායම තුළ හඳුනා ගෙන ස්කන්ධය සහ සංචිත යටතේ ඉදිරිපත් කරනු ලැබේ. සඵල පොළී අනුපාතික ක්‍රමය යොදා ගෙන අලෙවියට ඇති ණය සුරුකම්පත්වල පොළී ආදායම ගණනය කරනු ලබන අතර ලාභ හෝ අලාභ මත හඳුනාගනු ලැබේ. ආයෝජන අවසන් වන විට ස්කන්ධය තුළ ඇති උපචිත ලාභ හෝ අලාභ ලෙස නැවත වර්ගීකරණය කරනු ලැබේ. 2014 වසර තුළ සමාගමේ අලෙවියට ඇති මූල්‍ය ආයෝජන නොමැත (2013 - ශූන්‍ය).

**3.1.5.5 මූල්‍ය වත්කම් හානිකරණය වීම**

මූල්‍ය වත්කමක් හානිකරණය වී තිබේ ද යන්න පිළිබඳ කිසියම් විෂයබද්ධ සාක්ෂි සමාගම විසින් සෑම වාර්තාකරණ දිනයකදීම ඇගයීම් කරනු ලබන අතර එය සිදු වී ඇත්තේ නම් වත්කම සාධාරණ අගය සහ අනාගත ඇස්තමේන්තු කළ මුදල් ප්‍රවාහයේ වර්තමාන අගය අතර වෙනස අනුව අලාභය ගණනය කරයි.

**3.2 වගකීම් හා වෙන් කිරීම්**

මූල්‍ය තත්ව ප්‍රකාශන ඉදිරිපත් කරන දිනයේ සිට වසරක කාලයක් ඇතුළතදී ගෙවිය යුතු හෝ ඉල්ලූ විටදී ගෙවිය යුතු හෝ බැරකම්, ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ දක්වා ඇත. ශේෂපත්‍ර දින සිට වසරකට පසුව ගෙවිය යුතු බැරකම් ජංගම නොවන වගකීම් යටතේ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හඳුනා ගත් සියලුම දන්නා වගකීම් සහ බැරකම් ගිණුම් ගත කර ඇත. අතීත හේතූන් මත සමාගම වෙත පැවරී ඇති නෛතික හා සාධනීය බැඳීම් හඳුනා ගෙන ඒවා පියවීම සඳහා මූල්‍ය කැප කිරීමක් අවශ්‍ය වන නීතිමය බැඳීම් පවතින්නේ නම් ඒ සඳහා මූල්‍ය ප්‍රකාශන තුළ අවශ්‍ය වෙන් කිරීම් සිදු කරයි.

**3.2.1 මූල්‍ය වගකීම්**

**මූලික හඳුනා ගැනීම හා ඇගයීම**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් 39 ට අනුව මූල්‍ය වගකීම් ලෙස සාධාරණ අගය වන ලාභ හෝ අලාභ හරහා වන මූල්‍ය වගකීම, ණය හා ණයට ගැනීම් ලෙස වර්ගීකරණය කර ඇත. සමාගම එහි මූල්‍ය වගකීම් වර්ගීකරණය මුල් හඳුනා ගැනීමේ දී තීරණය කරනු ලැබේ. සියලුම මූල්‍ය වගකීම් මුල් අවස්ථාවේ දී සාධාරණ වටිනාකමට

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2014 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

හඳුනාගන්නා අතර ණය හා ණයගැනීම් ක්‍රමක්ෂය පිරිවැය මත හඳුනා ගනී. ඍජුව ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය මෙයට ඇතුලත් වේ.
සමාගමේ මූල්‍ය වගකීම් වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ තුළ ඇතුලත් වේ.

### 3.2.1.1 සාධාරණ අගය මත ලාභ හෝ අලාභ හරහා මූල්‍ය වගකීම්

ගණු දෙනු කිරීම සඳහා ඇති මූල්‍ය වගකීම් හා සාධාරණ අගය මත ලාභ හෝ අලාභ හරහා මූලිකව හඳුනාගත් මූල්‍ය වගකීම් සාධාරණ අගය මත ලාභ හෝ අලාභ හරහා ඇති මූල්‍ය වගකීම්වලට ඇතුලත් වේ. මූල්‍ය වගකීම් ආසන්න කාලයකින් අලෙවි කාර්යය සඳහා රඳවා ගත්තේ නම් ඒවා ගණු දෙනු සදහා රඳවා ගත් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ගනුදෙනු සඳහා රඳවා ගත් වගකීම්වල ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශනයේ හදුනාගනී. සාධාරණ අගය මත ලාභ හෝ පාඩු මත මූල්‍ය වගකීම් කිසිවක් සමාගම සතුව නැත.

### 3.2.1.2 ණය හා ණයට ගැනීම්

මූලික හඳුනා ගැනීමෙන් පසුව පොළී සහිත ණය හා ණයට ගැනීම් සඵල පොළී අනුපාතික ක්‍රමය යොදා ගෙන ක්‍රමක්ෂ පිරිවැයට අගයනු ලැබේ. සඵල පොළී අනුපාතික ක්‍රම ක්‍රමක්ෂය ක්‍රියාවලිය හරහා වගකීම් හඳුනා නොගන්නා විට මෙන්ම ලැබීම් හා අලාභ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනී. අනෙකුත් මූල්‍ය වගකීම් තුළ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ හා ගෙවිය යුතු ආදායම් බදුවලට ඇතුලත් වේ.

### 3.2.2 මූල්‍ය අවදානම් කළමනාකරණ පරමාර්ථ හා ප්‍රතිපත්ති

වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ හා ගෙවිය යුතු ආදායම් බදු සමාගමේ ප්‍රධාන මූල්‍ය වගකීම්වලට ඇතුලත් වේ. මෙම මූල්‍ය වගකීම්වල ප්‍රධාන අරමුණ වන්නේ සමාගමේ මෙහෙයුම් සඳහා මුදල් යෙදවීමයි. සමාගම විසින් රජයේ ව්‍යාපාර සඳහා ණය ලබා දී ඇති අතර වෙළඳාම හා අනෙකුත් ලැබිය යුතු දෑ මුදල් හා කෙටි කාලීන තැන්පතු සමාගමේ මෙහෙයුම් ක්‍රියාකරකම්වලින් ඍජුවම ලැබී ඇත.

ඒ අනුව සමාගම මූල්‍ය මෙවලම් භාවිතයේදී ණය අවදානම්, ද්‍රවශීලතා අවදානම්, මුදල් අවදානම් සහ පොළී අනුපාත අවදානම් ආදියට මුහුණ පානු ඇත.මෙම සටහන සමාගම මුහුණපාන එම අවදානම් ගැන තොරතුරු සපයන අතර ඒවා කළමනාකරණය පිණිස සමාගමේ අරමුණු සහ ප්‍රතිපත්ති මගින් පැහැදිලි කරයි.

### 3.2.2.1 ණය අවදානම

ණය අවදානම යනු සමාගම විසින් ණය සපයා ඇති පාරිභෝගිකයෙක් හෝ සම්බන්ධිත පාර්ශවයක් තම ගිවිසුම්, බැඳීම් ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වූ විට සමාගමට ලැබිය යුතු දෑ නොලැබීමෙන් ඇතිවනමූල්‍ය අලාභය යි.

### 3.2.2.2 ද්‍රවශීලතා අවදානම

සමාගමට මුදල් හෝ අනෙකුත් මූල්‍ය වත්කම් මඟින් පියවීමට ඇති එහි මූල්‍ය වගකීම් ආශ්‍රිත බැඳීම් ඉටු කිරීමේ දී මතු වන දුෂ්කරතා ද්‍රවශීලතා අවදානම් වේ.

සමාගමට සාමාන්‍ය හා පීඩාකාරී තත්වයන් තුළ සමාගමේ කීර්තියට හානියනක් නොමැතිව වෙනත් අලාභ ඇති නොවන ආකාරයෙන් හැකි තාක් දුරට සෑම විටම සිය වගකීම් පියවිය හැකි ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් සතුව තිබීම මෙම අවදානම කළමනාකරණය කිරීමේ ප්‍රවේශයක් වේ.

### 3.2.3 සේවක ප්‍රතිලාභ

#### (a) නිර්නය කරන ලද දායකත්ව සැලැස්ම - අර්ථ සාධක අරමුදල හා භාරකාර අරමුදල

නිර්ණය කළ දායකත්ව සැලසුම , පසු සේවා ප්‍රතිලාභ සැලසුමක් වශයෙන් සේවා යෝජක විසින් සේවකයන් වෙනුවෙන් නිශ්චිත දායකත්වයක් ලබා දෙන අතර ඊට වඩා වැඩි ගෙවීමකට නෛතිකව හෝ සාධනීයව බැදී නැත. සේවකයින් විසින් ලබා දෙන සේවය වෙනුවෙන් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා භාරකාර අරමුදලට සියලුම සේවකයින් සදහා කරනු ලබන ගෙවීම් වියදමක් සේ ලාභ අලාභ ප්‍රකාශනයේ සැලකේ.

සමාගම සේවකයින්ගේ දල වැටුපෙන් 12% ක් හා 3% පිළිවෙලින් සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා භාරකාර අරමුදලට මාසිකව ගෙවනු ලබයි.

# මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

2014 දෙසැම්බර් 31 අවසන් වර්ෂය

**(b) නිර්ණය කරන ලද ප්‍රතිලාභ සැලැස්ම**

නිර්ණය කල ප්‍රතිලාභ සැලසුම නිර්ණය කල දායකත්ව සැලසුම සහ සමාන පසු සේවා සැලසුමකි. නිර්ණය කළ ප්‍රතිලාභ පිරිවැය ගණනය කිරීමේ දී ආයු ගණක අගය කිරීම (Acturial valuations) පදනම භාවිත කරයි. ආයු ගණක අගය කිරීමේ දී වට්ටම් අනුපාතය අනාගත වැටුප් වැඩිවීම වැනි කල්පිතයන් ඇති කර ගනී. භාවිත කළ කල්පිතයන් පිළිබඳ විස්තර 16 වැනි සටහනේ දැක්වේ. ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු මගින් අරමුදල් වෙන්කර ඇත.

**3.3 විලම්බිත ආදායම**

**ප්‍රදාන හා සහනාධාර**

නිශ්චිතව ලැබෙතැයි විශ්වාස කළ හැකි රාජ්‍ය ප්‍රදාන ඊට අදාළ කොන්දේසි සහිත වනු ඇත. ප්‍රදානය වියදමක් ලෙස සැලකෙන විට, එක්තරා කලාසීමක් තුළ එයින් පියවීමට බලාපොරොත්තු වන අරමුණ ක්‍රමවත් පදනමක් මත ලැබෙන්නාවූ ආදායමක් සේ සැලකේ. එම ප්‍රදානය වත්කමකට අදාළ නම් එය වත්කමේ ආයු කාලය තුළ සමාන වාරික විලම්භිත ආදායමක් සේ වෙන් කෙරෙනු ඇත.

ප්‍රදාන දේපළ, පිරියත හෝ උපකරණ සඳහා නම් එම ප්‍රදානය දේපළ , පිරියත හෝ උපකරණවල ඵලදායී ආයු කලාය තුළ විලම්භිත අදායමක් සේ වෙන් කෙරෙනු ඇත.

වත්කම් ඒවායේ ඵලදායී ආයු කලාය හෝ පියවීමට ඇති කල්බදු කාලය යන දෙකෙන් අඩු එකට ක්‍රමක්ෂය කරනු ලැබේ.

| | |
|---|---|
| ගොඩනැගිලි | වසර 40 |
| ජල සැපයුම් | වසර 20 |
| මොටර් රථ | වසර 05 |
